| | - | - | - | ග | ති | ග | ත | ග | ති | - | ත | - | කු | - |
| | ඳා | - | - | - | - | - | - | | | | | | | |
| තානම | + | + | + | ත | මි | ද | න | තා | - | - | න | - | ත | - |
| | නා | - | - | - | - | - | ත | න | මි | - | ද | - | න | - |
| | + | + | + | ත | මි | ද | න | තා | - | - | න | - | ත | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | + | තෙ | යි | ත | න | තා | - | - | න | - | ත | - |
| | නා | - | - | - | - | - | ත | න | මි | - | ද | - | න | - |
| | + | + | + | තෙ | යි | ත | න | තා | - | - | න | - | ත | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කවිය | + | + | + | න | ද | දෙ | න | ක | වො | - | ර | - | ලෙ | - |
| | සි | න් | - | - | - | - | - | ද | - | - | - | - | - | - |
| | + | + | + | චා | - | ත | සු | ලු | ං | - | ගො | - | ස | - |
| | යෙ | න් | - | - | - | - | - | ද | - | - | - | - | - | - |
| | + | + | + | ගු | ගු | ර | ණ | හෙ | ණ | - | හ | - | ඬ | - |
| | යෙ | න් | - | - | - | - | - | ද | - | - | - | - | - | - |
| | + | + | + | නා | - | ද | - | දෙ | - | - | මි | - | - | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කලාසම | ජිං | - | ත | ගත් | - | තත් | - | ග | ති | ත | ගත් | - | තත් | - |
| | කු | කු | ඳ | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| | තා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අඩව්ව | ජිං | - | ත | ගත් | - | තත් | - | ග | ති | ත | ග | ත | දොං | - |
| | ග | ති | ත | කු | ඳ | කු | ඳ | ග | ති | ත | කු | ඳ | දොං | - |
| | ජිං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| | ත | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| | තා | | | | | | | | | | | | | |

## නාග ගජගා වන්නම

තාලය : මාත්‍රා 3 + 2 + 2 තුන් තිත

| | / 1 | 2 | 3 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | ^ 1 | 2 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | ජි | මිත් | - | තත් | - | කි | ට | ත | ක | ට | ජි | මි | ත | ක |
| තානම | + | තා | න | ත | න | ත | න | ත | තෙ | න | ත | න | ත | න |
| | + | තා | න | ත | න | ත | මි | දා | - | තෙ | නා | - | - | - |
| | + | - | - | - | - | - | - | අා | - | - | - | - | - | - |
| කවිය | + | සී - | ල | නා | - | ග | ව | + | කුලෙ | ක | බෝ | - | ස | ත් |
| | + | හස් | ති | රා | - | ජ | ව | + | උ | පන් | නේ | - | - | - |
| | + | කෝ | ල | නො | ව | බු | දු | + | බුව | ප | තා | - | ගෙ | න |
| | + | විදු | ල | ක | ප | මි | න් | + | දුන් | දු | නේ | - | - | - |
| | + | අා | - | - | - | - | - | අා | - | - | - | - | - | - |
| කලාසම | ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | කු | ද | කු | ද// |
| | ජිං | - | ත | ග | ත | කු | ද | ග | ති | ත | ග | ත | දොං | - |
| අඩව්ව | ත | තර් | ද | තත් | - | තත් | - | ත | තත් | - | තත් | - | තත් | - |
| | ත | තර් | ද | තත් | - | කි | ට | ත | ක | ට | කු | ද | දොම් | - |
| | ත | තර් | - | රැ | ද | දොං | - | ත | තර් | - | රැ | ද | දොම් | - |
| | ත | තර් | - | රැ | ද | දොං | - | දොං | - | ත | ගත් | - | තත් | - |
| | ග | තත් | - | කු | ද | ග | ත | තා | - | - | ගත් | - | තත් | - |
| | ග | තත් | - | කු | ද | ග | ත | තා | - | - | | | | |

**සැ. යු. :** ගායන පාඩමේ සඳහන් ව ඇති වන්නම් කවිය සම්පූර්ණයෙන් ප්‍රස්තාර කරන්න.
මෙය මාත්‍රා 3 + 4 දෙතිතේ තාලයට ද ප්‍රස්තාර කළ හැක

## යාදිනි මාත්‍රය

තාලය : මාත්‍රා 2 + 2 + 2 + 4 සිව් තිත

| | ^ 1 | 2 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | ජිං | - | කු | ද | තත් | - | කි | ට | ත | ක | ජිං | - | කු | ද | තත් | - | කි | ට | ත | ක |
| තානම | තා | - | - | - | න | - | තා | - | න | - | තා | - | තෙ | - | න | - | ත | - | න | - |
| | තා | - | - | - | න | - | තා | - | මි | - | දා | - | - | - | තෙ | - | නා | - | - | - |
| කවිය | ස | - | සී | - | රි | - | බ | - | ර | - | මේ | - | සී | - | රි | - | ල | - | ක | - |
| | දෙ | - | වො | - | ල් | - | දෙ | - | වි | - | පෙ | - | ර | - | ද | - | ව | - | ස | - |
| | උ | - | ප | - | න් | - | බ | - | ව | - | උ | - | ප | - | ත | - | අ | - | ස | - |
| | බ | - | ජ් | - | ම | - | න | - | මි | - | තෙ | - | ද | - | අ | - | සු | - | ර | |
| කලාසම | ජිං | කිට | කුං | දත් | තක් | කිට | දොම් | කිට | කිරි | තක | ජිං | කිට | කුං | දත් | තක් | කිට | දොම් | කිට | කිරි | තක |
| | ජිං | - | ග | ත | ගත් | - | දිත් | - | තත් | - | කු | ද | ග | ත | කු | ද | තා | - | - | - |
| අඩව්ව | ජිං | - | ජිං | - | ග | ත | කු | ද | ග | ත | කු | ද | ග | ත | ගත් | - | දිත් | - | තත් | - |
| | දිරි | කිට | තරි | කිට | ග | ත | කු | කු | දත් | - | තරි | කිට | තරි | කිට | ග | ත | කු | කු | දත් | - |
| | දිරි | කිට | තරි | කිට | ග | ත | කු | කු | දත් | - | කු | ද | ග | ත | කු | ද | තා | - | - | - |
| | ජි | ං | ග | ත | ගද් | - | දිත් | - | තත් | - | කු | ද | ග | ත | කු | ද | තා | - | - | - |

## සිංදු මාත්‍රය

තාලය : මාත්‍රා 2 + 2 + 4 තුන් තිත

| | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | ජිං | - | ජිං | - | තත් | - | කුර | තක | තත් | - | කි | ට | ජි | මි | ත | ක |
| තානම | + | + | + | තන | තා | මි | ද | - | නා | - | - | - | තා | මි | ද | - |
| | + | + | නා | - | තා | මි | ද | - | නා | - | - | - | - | - | - | - |
| | + | + | + | තෙයි | තා | මි | ද | - | නා | - | - | - | තා | මි | ද | - |
| | + | + | නා | - | නා | මි | ද | - | නා | - | - | - | - | - | - | - |
| කවිය | + | + | + | දිලු | ත් | - | දි | - | මු | - | තු | - | සො | - | ද | - |
| | + | + | ස | බ | ර | - | ග | - | මු | - | වෙ | - | අ | - | ඊ | - |
| | + | + | + | තෙරු | ව | - | න් | - | වැ | - | ද | - | ගෙ | - | න | - |
| | + | + | ආ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කලාසම | + | + | + | + | කු | කු | ද | ග | ති | ත | ග | ත | ග | ති | ග | ත |
| | කු | ද | ග | ත | කු | කු | ද | ග | ති | ත | කු | ද | ග | ති | ත | කු |
| | දිත් | - | තත් | - | | | | | | | | | | | | |
| අඩව්ව | - | - | - | - | ජි | ග | තත් | - | ජෙං | - | ත | ක | ජි | ග | තත් | - |
| | ජෙජී | - | ජෙං | - | ජි | ග | ත | ක | ත | ක | ත | ක | ජි | ග | තත් | - |
| | ජෙජී | - | ජෙං | - | ජි | ග | තත් | - | ජෙං | - | ත | ක | ජි | ග | තත් | - |
| | ජෙජී | - | ජෙං | - | ත | ක | ජි | ග | තත් | - | ජෙජී | - | ජෙං | - | - | - |
| | ජි | ග | ග | තා | | | | | | | | | | | | |

## තොරන් යාගය

තාලය : මාත්‍රා 4 තනි තිත

| | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අඩුකෝල් පදය | ජිං | - | ග | ත | ති | ත් | ත | ක | දොං | - | ග | ත | තිත් | - | තත් | - |
| | තත් | - | තත් | - | ත | හරි | ද | ක | තා | - | - | ග | තිත් | - | තත් | - |
| | ජී | ග | ත | ග | තිත් | - | ත | ක | දොං | - | ත | ග | තිත් | - | තත් | - |
| | තත් | - | තත් | - | ත | හරි | ද | ක | තා | - | - | ග | තිත් | - | තත් | - |
| | දොං | - | ග | ත | තිත් | - | ත | ක | ජිං | - | ත | ග | තිත් | - | තත් | - |
| | ජී | ග | ත | ග | තිත් | - | ත | ක | දොං | - | ත | ග | තිත් | - | තත් | - |
| | දොං | - | ත | ග | තිත් | - | තත් | - | ජිං | - | ත | ග | තිත් | - | තත් | - |
| | ග | ති | ග | ත | ග | ති | ග | ත | ග | ති | ග | ත | කු | ද | කු | ද |
| | ග | ති | ත | කු | දි | ත | ග | ත | ග | ති | ග | ත | දිරි | කිටි | තරි | කිටි |
| | තා | - | - | ජී | මිත් | - | තත් | - | ග | ති | ග | ත | තරි | කිටි | කුං | දත් |
| | තා | - | - | - | | | | | | | | | | | | |

# දිගු කවි තාලය

තාලය : මාත්‍රා 3 තනි තිත

| | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | ජිං | කිට | තත් | තත් | කිටි | තක | ජිං | කිට | තත් | තත් | කිටි | තක |
| කවිය | + | පොර | ණ | කු | ළ | පැ | + | විති | ර | ජ | කු | ළ |
| | + | යකි | පො | ර | - | ණ | - | - | - | - | - | - |
| කලාසම් | ජිං | - | ත | ග | ති | තු | තත් | - | කු | ඳ | ග | ත |
| | ග | ති | ත | කු | ළිත් | - | තත් | - | කි | ත් | තත් | - |
| අඩව්ව | තත් | කිට | හර් | ජික් | කිට | කුං | තත් | තිත් | තත් | ගත | තිත් | තත් |
| | ගති | කිට | හර් | ජික් | කිට | කුං | තා - | ගග | තිත් | ගත | ගත් | තත් |
| | තකු | දග | තිත් | කුඳු | ගත | කුඳු | තා | - | - | | | |

සැ.යු. : ගායන පාඩමේ සඳහන් ව ඇති වන්නම් කවි සම්පූර්ණයෙන් ප්‍රස්තාර කරන්න.

**ඇගයීම**

- මූලධර්ම අනුගමනය කරමින් ප්‍රස්තාර සටහන් සකස් කරන්න.
- නියමිත තාල රූප අනුව අදාළ පද, කවි, කස්තිරම්, සීරුමාරු, අඩව්/ඉරට්ටි/කලාසම් නිවැරදි ව ප්‍රස්තාර කරන්න.
- තාලාවබෝධය ලැබීමට ප්‍රස්තාරකරණය තුළින් ලැබෙන පිටිවහල පිළිබඳ අදහස් දක්වන්න.

**නිපුණතාව 1.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා ශිල්පීයධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1.3 :** නර්තනය හා බැඳි ගායනා නියමිත නාදමාලාවන්ට අනුව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.3.1 :** නර්තනය හා බැඳි කවි ගායනය කිරීම

**ඉගෙනුම් ඵල :**

- වන්නම්/සින්දු වන්නම් හා ප්‍රායෝගික කොටස්වලට අදාළ සාම්ප්‍රදායික කවි ගායනාවල පසුබිම විස්තර කරයි.
- අදාළ ගායනයන් හි නිවැරදි නාදමාලා අනුගමනය කරමින් ගායනය කරයි.
- බෙර/දවුල් වාදනයට අනුව තාල තබමින් ගායනය කරයි.
- කණ්ඩායම් වශයෙන් හා තනි ව ඒකීය හඬතලයක පිහිටා ගායනය කරයි.

**කාලය :** කාලච්ඡේද 14 යි

**ගුණාත්මක යෙදවුම් :** ශ්‍රව්‍ය පට, කවි ගායනා ලියන ලද පත්‍රිකා

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

අනුකරණ ක්‍රමය, අභ්‍යාස ක්‍රමය හෝ වෙනත් සුදුසු ක්‍රමවේද මේ සඳහා භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- වන්නම්/සින්දු වන්නම් හා ප්‍රායෝගික කොටසට අදාළ කවි නියමිත තාල රූපවලට අනුව ගායනය.
- සම්ප්‍රදායික නාදමාලාවන් ආරක්ෂා කර ගනිමින් ගායනය.
- හඬ පාලනයෙන් යුතු ව ගායනය.
- බෙර වාදනය හා ගායනය අතර පවත්නා සම්බන්ධතාව ආරක්ෂා කර ගනිමින් ගායනය.

## උඩරට සම්ප්‍රදාය

### මුසලඩි වන්නම

මාත්‍රා 3+4 දෙතිත හා මාත්‍රා 3 තනිතිත

බෙර පදය දෝං ජිං ජිං තකට දොංතක

තානම තානත්ත තනෙනත්ත තානම් - තම්ද
නානන්ත තනෙනත්ත තානම්

තනත් තනෙන තතන තනෙන
තානෙන තම්දාන තනෙන

තා නත්ත තනෙනත්ත තානම් - තම්ද
නා නත්ත තනෙනත්ත තානම්

කවිය වන පැත්ත බිය පත්ව සයනම්
දුටත් යනෙන විටත් දුවන
පිටත් පොට ගසා පනිමින
නැත නාඩි ඉඳවාඩි වෙව්ළුම්

නොනැවත යනු නැත එතනින්
හිරුත් අවර ගිරත් පැමිණි
කලත් වසන තැනින් දුවන
පැන ආඩි පත්රාසි බුදිමින්

සිරිගත්ත සඳුපත්ව මුදුනින්
විටත් ඔවුන තුටත් සිතින
මහත් සමඟියෙන් දුව පැන
උණුදෑඩි වනවාඩි ලන්නම්

මේ ඇත්තමයි සත්ත කියනෙම්
ගමනක් යන විලසක් ගෙන
ඉසිදුන් දෙවි කළ සතොසින
කර දැඩි මුසලාඩි වන්නම්

## සුරපති වන්නම

මාත්‍රා 3+4 දෙතිත

බෙර පදය දෝං ජිං ජිං තකට දොංතක

තානම : තනානත්තම් දන තනම්දන
තම්දනත් තම් දාන තනතම් //
දන තම් ද නා නා //

කවිය : ශ්‍රියාමත් පති උමඟනා දෙව්
නැති ව විලි සෝකයෙන් ඉසුරිඳු//
දෙවෙස වෙලාගති //

ගියා කොතනද නැති ව දැනුමක්
සෙව්ව කල ලැබුණා එ දෙව් දුව //
තෝස මනා රැති //

කියා රඟ නද තාලයෙන් වර්ණයක්
ගෙන හැර පෑව ඉසුරිඳු //
කේස සරඹ නිති //

නයා කරවට දරන සුරිඳුගෙ
වර්ණයක් ගෙන පෑව පරසිඳු //
වන්නම සුරපති //

## මයුරා වන්නම

මාත්‍රා 2 + 2 + 3 තුන්තිත

බෙර පදය : තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං
ගත් තත් ජිං තරි කිට

තානම : තනෙන තන තන තනෙන තන තන
තනෙන තන තනෙනා

තිනෙන තින තින තිනෙන තින තින
තිනෙන තින තිනෙනා

කවිය : සතර සිව්වර බලැති දිඩතර
සුරිඳුනෙයි කදිරා
කතරගම පුර සුරිඳු වාහන
කරති රණ මොණරා
පතර තෙද ගම්බීර සතට සෙත
වේල අවිය දරා
නොහැර ඉසිවර යෙදුව මෙමයුර
වර්ණකර මයුරා

**අස්නෙ**

* අපගෙ මුනි රජාණන් - විශාලා නුවර ගොස්
එකුසිනාරා නුවර - වැඩම කළ තුල්‍ය භුජ

* සුපුන සොමි වන කැළුම් - දිලිය වට සේ පෙනේ
හමන මද නළ සඳුන් - සිසිල ගිනි සේ දැනේ

* කොයි ගොසින් කොයි අනේ
රැකෙමුදෝ දෙවිය නේ
අහෝ දුක කියමි නේ
කිය කියා හඬමි නේ

* සිංහ පුර වර සොඳා
රජ ඉසුරු විඳ වි ඳා
කරන නොපනත් සදා
නැවි නැඟී යන සඳා

* දැන් සොඳුර තනිව මම
යුරු කොමල භුජ වැළඳ
පවර රජ කුමරිය ක
ගෙන්නවා අභිෂේ ක

**පහතරට සම්ප්‍රදාය**

**හාවාදී තාලය - සින්දු වන්නම**

මාත්‍රා 2+3 දෙතිත

බෙර පදය : දිං ගති ගතං දොංත ගුඳ ගති ගතං දොංත
දිං ගති ගතං දොංත දොං තා

තානම : තෙන තෙම් තෙනම් තෙනෙන
තෙන තෙම් තෙනම් තෙනෙන
තෙන තෙම් තෙනම් තෙනෙන
තෙනෙනා

කවිය : සැමට ම හයන්කාර වෙමිනිදු එවන් මුහුල
බලයෙන් යුදට පිවිස එදිනේ
නම කළ විකුම් නෑර පල කළ රොසින් නේක
කුලවර සවන් සහස නදිනේ
දුම දුටු බිඟුන් සේ ම බිඳ හැර ඔවුන් සෑම
සේකර නරන් සුරිඳු සරණේ
පෙමකර සිතින් බෝම නමකර කියන් ලෝක
සත රැක දෙවන් ඉසුරු නිතිනේ

## කොණ්ඩනාවෙච්චි තාලය - සින්දු වන්නම

මාත්‍රා 4 තනි තිත

බෙර පදය : ගත්තම් දොම් ගත ගුගුඳ ගුඳං (දිතගත)

තානම : තෙනින තෙනින තෙන තෙම්තෙන
තෙනින තෙනින තෙන තෙනෙනා

කවිය : පෙමිණ කුළුණු මිතුරු ගුණෝන් ඇදින මුනිඳු සඳසෙරූප
දෙමින දසත දිගැති පතල තෙදැති යුගැති රිවි සෙ තාප
නමින සහස පසිඳු නීල පුල්වන් දෙවිඳුනි ප්‍රතාප
දෙමින අභය සිරි දී රකු සෑම නරන් නොකර කෝප

## ශුද්ධ තාලය - සින්දු වන්නම

මාත්‍රා 2 + 2 + 3 තුන්තිත

බෙර පදය : දිත්තම් දිතකු දොම් දොම් තා

තානම : තෙන තෙන තෙන - තෙන තෙන තෙන
තෙන තෙනි නා ආ . . . .
නා තෙන තෙන - තෙන තෙන තෙන
තෙන තෙනි නා ආ . . . .

කවිය : සිරිපිරි ගිරි මුදුනත සුර පුර ලෙසිනා
සිරිලක පවර දෙවි නුවරෙහි වෙසෙස ව නා
සිරිඟර සමග සිරිසඳ සමගි ව වෙසෙනා
සුරිඳුනි අසනු මකියන බස බැති පෙමිනා

## ශුද්ධ මාත්‍රය

1. අත්තන මල සේ ඇඳ සුදු සේලය ඉනවට රැළි අල්ලා
නෙළුම් මලක් සේ බඳිනා කොණ්ඩය මල් පෙති ගවසා ලා
ගත ගනරන් ඔබෙ මුකුළු සිනාවට බැම දෙක ඉඟි කරලා
බලා සිටින් සකි ලඳ යන අන්දම තාලෙට පා තබලා

2. මෙලෙසින් මල් මද දේවියේ
යුධයට කොඩි බැඳ ඒ වියේ
මගෙ සකියනි නුඹ පාවි යේ
සබ නැටුවා මා දේවියේ

මෙලෙසින් මල්මද දුල් ලා
යුධයට කොඩි බැඳ චිල් ලා
මගේ සකියනි නුඹ පල් ලා
දෙම් කරලන රන් තැල් ලා

3. නිල්ලා රැලි ලා අඳිනා සේලය තුනු ඉඟ බබලව තෙයි
සංගා පුස්කොළ තෝඩු තබාලා සවන් පටින් බඳි තෙයි
ළැමැද පුරා චින පීන පයෝධර රන් පටියෙන් බඳි තෙයි
මේ සබයෙන් අප දිනවා දෙන්නට සැමදෙවි පිහිට වෙතෙයි

### දුම්මල පදය

1. සල්මල් වනයට නා රජ වැඩ ලා
   සල් දුම්මල පෙන ගොබේ වසා ලා
   දුම්මල මාලාවක් පුද කර ලා
   දෙන් සෙත දුම්මල ගෙනත් වඩා ලා

2. සුවඳ උතුම් දුම්මල වඩවන් නේ
   පැළඳ වීදි වට සුවඳ කරන්නේ නේ
   නිබඳ ව සෙත සලසා රැක දෙන් නේ
   සුවඳ අසන යකු සැවො ම වරෙන් නේ

## සබරගමු සම්ප්‍රදාය

### තිසරා වන්නම

මාත්‍රා 3 තනි තිත

දවුල් පදය : ජිං කිට තත් තත් කිටිතක

තානම : තම්දනා තාන තනෙන තම්දනා තාන තනෙන
තාන තනෙන තාන තනෙන
තාන තානෙනා තම්

කවිය : රන් රසා සේ ම වඩන වන් යසා රූප දිලෙන
වීම සදිසි නාම විලස ඒම රජතුමා නන්
ඉන් නිසා සෑම එදන උන් අසා ගීත නදින
තාල වයන ගායන කර සෑම වැසි දනන් දුන්
මන් මෙසා බාවට බැස දැන් ඉතා රාග වඩන
කීම් සොඳට ආලය කර නාමකර උතුම් සෙන්
අන් නිසා කීව පොරණ දැන් අසා මේ සබ මැද
පේම වඩන මේ තිසරා වන්නම් පවසන් දැන්

## මේඝ වන්නම

මාත්‍රා 3 + 4 දෙතිත

දවුල් පදය : ජිං ගත ගතිත කුඳා - කුදත්ගත
ගතිගත ගතිතකුඳා

තානම : තම්දන තාන තනා තන තම්දන
තම්දන තාන තනා
තෙයිතන තාන තනා - තනම්දන
තෙයිතන තාන තනා

කවිය : නද දෙන කටොර ලෙසින් ද - වාත සුලං ගොසයෙන් ද
ගුගුරණ හෙණ හඬයෙන් ද - නාද දෙමිනා
වලාහක සුරමනනන්ද චක්‍රායුධ ගැසුමෙන් ද
අජට කුශඨ හිම කන්ද - වාතය වන හෙයිනා
තකජෙං යන පදයෙන් ද - තෝරාගත් මෙලෙසින් ද
දන පිනවන විලසින් ද - පද ඇඳිනා
මෙකල නමින් පසසින් ද - පවසන සිතුවිලසින් ද
වන්නම මේඝ නමින් ද අසම ගෙනා

## නාග ගජගා වන්නම

මාත්‍රා 3 + 2 + 2 තාලය

දවුල් පදය : ජිමිත් තක්කිට තකට ජිමිතක

තානම : තාන තන තන තනෙන තන තන
තාන තන තම් දානෙනා
තනෙන තන තන තනෙන තන තන
තනෙන තන තම් දානෙ නා

කවිය : සීල නාග ව කලෙක බෝසත්
හස්ති රාජ ව උපන් නේ
කෝල නොව බුදු බව පතා ගෙන
එ දළ කපමින් එ දන් දුන්නේ
සීල ගුණ ඇති වීර විකුමැති
එමාතාණෝ බුදු උනේ
ආල වඩවන නාග ගජගා වන්නමේ
හැටි මෙලෙසි නේ

**යාදිනි මාත්‍රය**

මාත්‍රා 2 + 2 + 2 + 4 සිවු තිත

දවුල් පදය : ජිං කුඳ තත් කිටිතක

තානම : තාන තන තනෙන තන තා න තම්
දානෙනා

කවිය : සසිරි බර - මෙසිරි ලක
දෙවොල් දෙවි - පෙර දවස
උපන් බව - උපත අස
බස්ම නම් තෙද අසුර
තපස් රැක ඉසුරු දොර
ගිනි ජලය වරම් ගෙන
ඉසුර තන මැයි සිතා
විලවන්න ගති පටන්

**සින්දු මාත්‍රය**

තාලය : 2 + 2 + 4

දවුල් පදය : ජිං ජිං තත් කරතක
තත් කිට ජිම් තක

තානම : තන තම් ද නා තම් ද නා තම්ද නා නා
තෙයි තම්ද නා තම් ද නා තම් ද නා නා

කවිය : දිලුත් දිමුතු සොඳ සබරගමුවෙ අපි
තෙරුවන් වැඳගෙන ආ . .
මලුත් පහන් පුද කරමින් දෙවිඳුට
දෙවියන් වැඳගෙන ආ . .
ගලුත් බැඳපු සොඳ ඇඳුනුත් ඇඳගෙන
ගුරුවර නාමෙන් ආ . .
සබරගමුවෙ දෙවියන්ගේ නාමෙට
අපි මේ නැටුමට ආ . .

## තොරන් යාගය

**කෙටි කවි :**

* එකල් පෙර දවසා
සේරමානන් රජුගෙ සිරසා
ලෙඩක් උණ විල සා
එදා ගම්මඩු ගත්තු එනිසා

* නොයෙක් පාලි දැනා
ගත්තුව තොරන් වෙන වෙනා
ඇති රඟ පිළිවෙළි නා
මදක් පවසන් අසනු එල් එනා

**දිග කවි**

මාත්‍රා 3 තනි තිත

දවුල් පදය : ජිං කිට තත්, තත් කිටිතක

කවිය : පොරණ කළ පැවති රජ කුලයකි පොරණ
පොරණ එදා සක් බඹ ඉසිවර නර ණ
උරණ නොවී ආතුර රැක දෙති පොර ණ
කරනු රජ කුලට රන් තොරණ මෙලෙසින

**කෙටි කවි**

මාත්‍රා 3 තනි තිත
දවුල් පදය : දොංත තකට

කවිය : මකර රුව තනා තොරණේ මුදුනක ට
එතෙර කඩු පලිස් රජ දරුවන් අත ට
සතර වටට මල්පෙති සරසා සොඳ ට
මකර තොරණ බලයෙන් දෝස දුරු කොට

## දළුමුර පාලිය

**දිග කවි**

මාත්‍රා 3 +4 දෙතිත

දවුල් පදය : කුඳත් තක්කිට

කවිය : උපන්නේ දළුමුර නාගලොව නා රජුගෙ විස ධූමයෙන්
ගෙනෙන්නේ පොත් කඩක අසුරා රැගෙන දළුමුර කුසුමයෙන්
එවන් දළුමුර යාග දක්වා සියලු රෝ දුක් දුරලමින්
හරින්නේ සැම සියලු පිරිපත එමහ කෙළනා රජු බලෙන්

**කෙටි කවි**

මාත්‍රා 3 තනි තිත

දවුල් පදය : දොංත තකට

කවිය :
මින් තුන් ලොව සෑම සතට පෙනෙයි සොඳ
රන් තෙල්ලෙන් අඳිමින් රුව සඳ මැද
ඉන් දැමු තෙල් ලද දෙරණ වැටුණු සඳ
සුන්කර දෙරනත පලාගියේ සොඳ

**ඇගයීම**

- වන්නම්/සින්දු වන්නම් සහ ප්‍රායෝගික කොටසට අයත් අනෙකුත් කවි නිවැරදි නාදමාලාව අනුව ගායනය කරන්න.
- බෙර වාදනයට අනුව තාල තබමින් ගායනය කරන්න.
- වීකීය හඬ තලයක පිහිටා අදාළ කවි කණ්ඩායමක් ලෙස ගායනය කරන්න.
- වීකීය හඬ තලයක පිහිටා අදාළ කවි තනි ව ගායනය කරන්න.
- ප්‍රායෝගික කොටස් හා බැඳි කවි ගායනයන් හි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

**නිපුණතාව 1.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා ශිල්පීය ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1.3 :** නියමිත නාද මාලාවන්ට අනුව සාම්ප්‍රදායික හා ගැමි ගායන ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.3.2 :** සාම්ප්‍රදායික හා ගැමි කවි ගායනය

**ඉගෙනුම් ඵල :**

- නමස්කාර, අෂ්ටක, කඩතුරා, හත්අඩිය, රට යකුමේ නානුමුරය, කොහොඹා හෑල්ල, මඩුපුරය, කුමාර සමයම, බඹර කැපීම, ටීකා , පත්තිනි සවුදම යන කවි හා බැඳි පසුබිම විස්තර කරයි.
- අදාළ කවි නිවැරදි නාදමාලාවන්ට අනුව ගායනය කරයි.
- ආඝාතාත්මක හා අනාඝාතාත්මක ලක්ෂණ හඳුනා ගනිමින් නිවැරදි උච්ඡාරණයෙන් යුතු ව ගායනය කරයි.
- බෙර වාදනයට අනුව තාල තබමින් ගායනය කරයි.
- ඒකීය හඬතලයක පිහිටා තනි ව හා කණ්ඩායම් වශයෙන් ගායනය කරයි.

**කාලය :** කාලච්ඡේද 20 යි

**ගුණාත්මක යෙදවුම් :** සාම්ප්‍රදායික හා ගැමි කවි ලියන ලද පත්‍රිකා, ශ්‍රව්‍ය පට, බෙර, තාලම්පට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය හෝ වෙනත් සුදුසු ක්‍රම යොදා ගත හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- සාම්ප්‍රදායික ගායනය හා ගැමි ගායනය කෙරෙහි පදනම් වූ පසුබිම.
- සාම්ප්‍රදායික නාද මාලාවන් ආරක්ෂා කර ගනිමින් ගායනය.
- ගායනයේ ආඝාතාත්මක හා අනාඝාතාත්මක ලක්ෂණ .
- ගායනයේ දී නිවැරදි ව වචන උච්ඡාරණය.
- ගායනයේ දී හඬ පාලනය.

## පත්තිනි සවුදම

නිතිනි දන මන නයන පිනවන
දුල් සිරින් දෙවඟනක විලසා
අතිනි ගණ රන් සළඹ අරගෙන
නරන් හට සෙත සදන විලසා
පතිනි දෙව්දුට නැමද කියනෙමි
නරන් උවදුරු හරින විලසා
පතිනි සවුදම ගයමි අද මම
මේ සබේ මැද පුදුම විලසා

තත් දිත් තොන් නම් තාල උදාරය
විමනෙක සව්දම් දෙව් හෘද පාදය
චන්ද්‍රවතීගේ ඉන්ද්‍ර නීල ගත
විමනෙක සුරුළු වනේ
තකනං ජෙහෙකිට ජලක විනෝදන
ගත්තු චිරත්‍රාං සළඹ අතේ
සෙත්සිරි දෙවනා පත්තිනි කරුණා

ආඬි තුඬ පඬි පුර ජෙහෙනුක තත් තරි
තා හක ජෙජ් ජෙං තා
ගයමි මම පත්තිනි සුර සවුදම් //

## නමස්කාර ගාථා

මේරුං විරාජිත සමං - විහ බුද්ධ රාජං
ශ්‍රී දන්ත සාගර සමං - විහ ධම්ම රාජං
සත් කූල පබ්බත සමං - විහ සංඝ රාජං
ශ්‍රී බුද්ධ ධම්ම ගුණ සංඝ - වරං නමාමි

## අෂ්ඨක

ත්‍රෛලෝක්‍ය තිලකං ශ්‍රේෂ්ඨං
ඉෂ්ටාර්ථ සිද්ධි සම්භවං
ප්‍රණමාමි සතතං භක්තිං
රත්නත්‍රයේ සර්ව මංගලම්

## කඩතුරා කවි

සිද්ධ මුනිඳු වැඩහිඳ බෝ මුල විදුරාසන
යුද්ධ කරන්නට දසබිම්බර විත් පැරදුණ
වැද්ද නොදී හැම පිරිපත දුරලා හරිමින
බුද්ධ රත්න අනුහසයෙන් කඩතිර හරිමින

### හත් අඩියේ කවි

එක් දින මොහොතින් නැකත ද රැගෙනේ
රුක්කටු ගසමින් සිරකළ අරණේ
එක් කරවා රුසි නම දෙන අතිනේ
එක් අඩියට ඉර ඇන්දෙමි දෙරණේ

### රට යකුමේ නානුමුර කවි

රන් විල රිද්දි විල කෙළිනා බිසවුන්ට
මැණික් විලේ දිය නාලා ගොඩ එන්ට
අයවන පුද පඬුරු හෙප්පුව පුරවන්ට
රන් රුව සේ ම බිසවුන් යහනට එන්ට

### මඩු පුරයේ කවි

රජ කුලයට මොන මලදෝ
බමුණු කුලට මොන මලදෝ
වෙළඳ කුලට මොන මලදෝ
ගොවි කුලයට මොන මලදෝ

රජ කුලයට රනින් මලයි
බමුණු කුලට රිදී මලයි
වෙළඳ කුලට තඹෙන් මලයි
ගොවි කුලයට මෙ පොල් මලයි

### කොහොඹා හැල්ල කවි

කොසඹෝ දිය නාපු - වයිවයි ගොඩ පැනපු
පා වැඳලා සිටපු - සිටි මල රජ දැකපු

අක්ක ඉතින් නාඩන්නේ - එක් ව ගොසින් අප එන්නේ
දුක් ව සිතක් නොසිතන්නේ - දැක්මක් නැත කොසොඹන්නේ

ඉනේ සවඩි රන් කෙඳිවන් - පයේ වළලු ගිගිරි ලවන්
මෙසේ කොමළ බොළඳ ලියන් - අනේ මලනි දුටොත් කියන්

### කුමාර සමයමේ කවි

නාලිය සපු දුනුකේ සිහිනිද්දා
දූලිය සව්කෙන්ද ද වතු සුද්දා
දාලිය අළුවෙන් ඉපදුනි සුද්දා
ඒ ලිය වෙනුවට මේ පුද ලද්දා

### ටීකා සීපද

අන්දර කැලේ දර ලීයේ කුරුමිණි යා
කැන්දර අලේ - අන්දර කැලේ
ලිර දයියේ - දර ලීයේ
මිරිකුණියා - කුරුමිණියා
තාදිම්බර - තකදිම්බර - තා දි ඹරේ - තකදිඹරේ
ඩිංඩිණිකෝ - ඩිංඩිණිකෝ
මැංගිරි ඩිණිකෝ - ඩිංගිරි මැණිකෝ
මේ ඩිංගත් තෝ කාකෝ - ඔය ඩිංගත් තෝ කාකෝ
තම් දෙන තම් දාන තානෙනා
බිනර මලේ තුඩ නෑර ම රොන් ගනි යා
මනර බිලේ - බිනර මලේ
නැඩතූර ම - තුඩ නෑර ම
ගන් රොනියා - රොන් ගනියා
තා දිම්බර - තක දිම්බර - තා දි ඹරේ - තකදඹරේ
ඩිං ඩිනිකෝ - ඩිං ඩිනිකෝ
මැංගිරි ඩිණිකෝ - ඩිංගිරි මැණිකෝ
මේ ඩිංගත් තෝ කාකෝ - ඔය ඩිංගත් තෝ කාකෝ
තම් දෙන තම් දාන තානෙනා

### බඹර වි

ඕඩි හෙලේ හෙල වටකර මුළුල්ලා
ගල් නලලත බැන්දා වැනි තොටිල්ලා
තොටිල්ල මුලට යන කොට කර කැවිල්ලා
මදුගම හෙලේ බලතොත් මෙහෙ වරෙල්ලා

**ඇගයීම**

- සාම්ප්‍රදායික කවි හා ජන කවි සඳහා පසුබිම් වී ඇති කරුණු ඉදිරිපත් කරන්න.
- සාම්ප්‍රදායික කවි හා ජන කවි නිවැරදි නාද මාලාවන්ට අනුව ගායනය කරන්න.
- ඒකීය හඬතලයක පිහිටා අදාළ කවි නියමිත නාදමාලාවන්ට අනුව කණ්ඩායම් වශයෙන් සහ තනි ව ගායනා කරන්න.

**නිපුණතාව 1.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා ශිල්පීය ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1.4 :** වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම භාවිත කරමින් වාදනය කරයි.

**ක්‍රියාකාරකම 1.4.1 :** බෙර / දවුල් සරඹ 4 - 6 දක්වා වාදනය කිරීම.

**ඉගෙනුම් ඵල :**

- බෙර / දවුල් සරඹ පද තාල තබමින් කියයි.
- වාදනයේ දී නියමිත අක්ෂර උත්පාදනය වන අයුරින් බෙර පද වාදනය කරයි.
- ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි.
- ලය පවත්වා ගනිමින් හඬ පාලනයෙන් යුතුව සාමූහික ව බෙර වාදනය කරයි.
- බෙර / දවුල් සරඹ පද ලයමානය පවත්වා ගනිමින් පාලනයෙන් යුතු ව තනි ව වාදනය කරයි.

**කාලය :** කාලච්ඡේද 08 යි

**ගුණාත්මක යෙදවුම් :** සරඹ ලියන ලද සටහන්, ශ්‍රව්‍ය පට, බෙර / දවුල්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

අභ්‍යාස, ප්‍රදර්ශන, සාකච්ඡා ක්‍රම හෝ වෙනත් සුදුසු ක්‍රම භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- බෙර / දවුල් සරඹ තාල තබමින් කීම.
  - සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව
- බෙර / දවුල් සරඹ වාදනයේ දී නියමිත අක්ෂර වාදනය.
  - බෙරයේ වම දකුණ ස්ථාපනය වන පද
  - වාදන ශිල්පීය ක්‍රම
- බෙර / දවුල් සරඹ සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව වාදනය.
  - වේග පාලනය
  - ගුණ කිරීමේ දී නියමිත අක්ෂර උත්පාදනය
- සාමූහික වාදනයේ දී පද නිවැරදි ව වාදනය හා ලය පවත්වා ගැනීම .

**උඩරට බෙර සරඹ**

4. තකට තකට කුඳ තක්කට කට කුඳ

5. තත් තත්කඩ ජික් ජික්කඩ
   දොං දොංගඩ නං නංගඩ

6. තක්කට දොං දොංගඩ දොංගඩ දොං දොංගඩ

**පහතරට බෙර සරඹ**

4. කිට තරිකිට කිට තක්කඩ තරිකිට

5. කිට තරිකිට කිට තත්කඩ තරිකිට
   කිට තරිකිට කිට දික්කඩ තරිකිට
   කිට තරිකිට කිට දොංගඩ තරිකිට
   කිට තරිකිට කිට නංගඩ තරිකිට

6. කිට තරිකිට කිට තරිකිට කිට තක්කඩ තරිකිට
   කිට තරිකිට කිට තරිකිට කිට දික්කඩ තරිකිට
   කිට තරිකිට කිට තරිකිට කිට දොංගඩ තරිකිට
   කිට තරිකිට කිට තරිකිට කිට නංගඩ තරිකිට

**සබරගමු දවුල් සරඹ**

4. තරිඟු තකට දිරිඟු තකට

5. තරි තරිකිට දිරි දිරිකිට තරිකිට දිරිකිට

6. ජෙංගඩ ජෙං ජෙං කිත්තත්
   ජෙං ජෙංගඩ ජෙංගඩ කිත්තත්

**ඇගයීම**

- බෙර / දවුල් සරඹ පද ලය තුනට තාල තබා කියන්න.
- 4, 5, 6 සරඹ පද ලය තුනට වාදනය කරන්න.
- කණ්ඩායමක් වශයෙන් නියමිත බෙර / දවුල් පද අක්ෂර උද්පාදනය වන සේ වාදනය කරන්න.
- සරඹ පද තනි ව සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව වාදනය කරන්න.

**නිපුණතාව 1.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා ශිල්පීය ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1.4 :** වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම භාවිත කරමින් වාදනය කරයි.

**ක්‍රියාකාරකම 1.4.2 :** වන්නම් / සින්දු වන්නම්වලට අයත් බෙර පද/දවුල් පද අලංකාර බෙර පද/දවුල් පද, කස්තිරම්/කලාසම්/ඉරට්ටි වාදනය කිරීම.

**ඉගෙනුම් ඵල :**
- වන්නම්/සින්දු වන්නම්වලට අදාළ මූලික බෙර පද/දවුල් පද වාදනය කරයි.
- වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම භාවිත කරමින් මූලික බෙර පදවලට අනුව අලංකාර බෙර පද වාදනය කරයි.
- කවි ගායනය කරමින් මූලික බෙර පද හා අලංකාර බෙර පද වාදනය කරයි.
- වන්නම් /සින්දු වන්නම්වලට අදාළ කස්තිරම්/ඉරට්ටි/කලාසම් නියමිත තාල රූප අනුව කණ්ඩායම් වශයෙන් වාදනය කරයි.
- වන්නම් / සින්දු වන්නම්වලට අදාළ බෙර පද/දවුල් පද/ අලංකාර පද කස්තිරම්/ ඉරට්ටි කලාසම් තනි ව වාදනය කරයි.

**කාලය :** කාලච්ඡේද 14 යි

**ගුණාත්මක යෙදවුම් :** දෙවොල් බෙරය/ගැට බෙරය/දවුල, තාලම්පට, අදාළ බෙර/දවුල් පද ඇතුළත් ශ්‍රව්‍ය පට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

අභ්‍යාස ක්‍රමය, අනුකරණ ක්‍රමය, පියවර ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය හෝ සුදුසු වෙනත් ක්‍රමවේද භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**
- අදාළ වන්නම්වලට අයත් මූලික බෙර පද වාදනය.
- අදාළ වන්නම් හි මූලික බෙර පදවලට අනුව අලංකාර පද වාදනය.
- ගායනය සමග අදාළ වන්නම් හි බෙර පද වාදනය.
- වන්නම්වලට අයත් කස්තිරම් / ඉරට්ටි/ කලාසම් නියමිත තාල රූපවලට වාදනය.

**උඩරට වන්නම්**

| වන්නම | තාල රූපය | බෙර පදය | අලංකාර බෙර පද |
|---|---|---|---|
| මුසලඩි වන්නම | 3 + 4 | තකුං ජිං ජිං තකට දොංතක ජිංග ත ගො ගො | - දොංතකු දොං ජිංජිං ගත්තත් ජිං තත්තත් ජිං ජිං කඩතක<br>- ජිං තත්තත් ජිං දොං දොං |

| | | | |
|---|---|---|---|
| සුරපති වන්නම | 3 + 4 | නකුං ජිං ජිං තකට දොංතක | - දොංතකු දොං ජිං ජිං<br>ගත්තත් ජිං ගත්තත්<br>ජිං ජිං කඩතක |
| මයුරා වන්නම | 2 + 2 + 3 | තෙහිං තකු // තෙහිං ජිං<br>ගත් තත් ජිං තරිකිට | - තෙහිං තකු // තෙහිං ජිං<br>තක්කට කටතක ජික්කට<br>කඩතක ජිං තරිකිට |

**පහත රට සින්දු වන්නම්**

| සින්දු වන්නම | තාල රූපය | බෙර පදය | අලංකාර බෙර පද |
|---|---|---|---|
| භාවාදි තාලය | 2 + 3 | දිං ගතිගතං දොංත<br>ගුඳ ගතිගතං දොංත<br>දිං ගති ගතං දොංත<br>දොං තා | පහත රට සින්දු වන්නම්වල<br>අලංකාර බෙර පද නොයෙදේ. |
| කොණ්ඩනාවෙච්චි තාලය | 4 + 4 | ගත්තම් දොං ගත<br>ගුගුඳ ගුඳං (දිතගත) | |
| ශුද්ධ තාලය | 2 + 2 + 3 | දිත් තම් දිතකු<br>දොම් දොම් තා | |

**සබරගමු වන්නම්**

| වන්නම | තාල රූපය | බෙර පදය | අලංකාර බෙර පද |
|---|---|---|---|
| තිසරා | 3 + 3 | ජිංත ගත ගත ගත<br>ගතිත ගත ගත ගත<br>ජිංත ගත ගතිත ගත<br>ගතත් කුඳත් තා තකට | ජිං තරිකිට ගතත් ගතත් තා<br>ගත් තරිකිට ගතත් ගතත් තා<br>ජිං තිරිකිට ගතත්<br>ගත් තරිකිට ගතත්<br>ගත් තරිකිට ගතත් ගතත් තා<br>කුඳ ගත කුඳ තා |
| මේඝ | 3 + 4 | ජිංගත ගතිත කුඳා<br>කුඳත් ගත<br>ගති ගත ගතිත කුඳා | ජිංකිට ගත්තත්<br>ගතිගත කුඳ කුඳ තා<br>කුඳත් ගත<br>ගති ගත ගත්තත්<br>ගති ගත කුඳ කුඳ තා |

| | | | |
|---|---|---|---|
| නාග ගජගා | 3 + 2 + 2 | ජිමිත් තක්කිට තකට<br>කිටිතක | ජිං ජිමිතක<br>තත් කිට කිටිතක<br>තත් කිටිතක<br>තත්කිට කිටිතක |

**ඇගයීම**

- වන්නම් / සින්දු වන්නම්වලට අදාළ මූලික බෙර /දවුල් පද වාදනය කරන්න.
- වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම භාවිත කරමින් අලංකාර පද වාදනය කරන්න.
- කවි ගායනය කරමින් මූලික බෙර / දවුල් පද හා අලංකාර පද වාදනය කරන්න.
- වන්නම් / සින්දු වන්නම්වලට අදාළ කස්තිරම් / ඉරට්ටි / කලාසම් නියමිත තාල රූප අනුව කණ්ඩායම් වශයෙන් වාදනය කරන්න.
- අදාළ වන්නම් ගායනය කරමින් බෙර පද සහ අලංකාර පද, කස්තිරම් / ඉරට්ටි / කලාසම් තනි ව වාදනය කරන්න.

**නිපුණතාව 1.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා ශිල්පීය ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1.4 :** වාදනයේ දී අනුගමනය කළයුතු ශිල්පක්‍රම භාවිත කරමින් වාදනය කරයි.

**ක්‍රියාකාරකම 1.4.3 :** මගුල් බෙර පළමු වට්ටම වාදනය කිරීම.

**ඉගෙනුම් ඵල :**
- සාම්ප්‍රදායික ගති ලක්ෂණ ආරක්ෂා වන පරිදි මගුල් බෙර පළමු වට්ටම වාදනය කරයි.
- ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් මගුල් බෙර වාදනයේ යෙදෙයි.
- දම් - දොම් ලක - බුරුල පිළිබඳ අවබෝධයෙන් යුතුව මගුල් බෙර වාදනය කරයි.
- හඬ පාලනයෙන් යුතුව සාමූහිකව හා තනිව මගුල් බෙර වාදනය කරයි.

**කාලය :** කාලච්ඡේද 12 යි

**ගුණාත්මක යෙදවුම් :** මගුල් බෙර ලියන ලද සටහන, ශ්‍රව්‍ය පට, බෙර/දවුල්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

ප්‍රදර්ශන ක්‍රමය, අභ්‍යාස ක්‍රමය හෝ වෙනත් සුදුසු ක්‍රමවේද භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**
- මගුල් බෙර පළමු වට්ටම සාම්ප්‍රදායික ගති ලක්ෂණ අනුව වාදනය
- අක්ෂර නිවැරදි ව උත්පාදනය වන පරිදි මගුල් බෙර වාදනය
- ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් වාදනය
- දම් - දොම් ලක - බුරුල පිළිබඳ අවධානය ඇතිව හඬ පාලනයෙන් යුතුව මගුල් බෙර වාදනය
- හඬ පාලනයෙන් යුතු ව සාමූහිකව හා තනි ව වාදනය

## මගුල් බෙර

### උඩරට නර්තන සම්ප්‍රදාය

දේව පදය - තං ජිං /// තක ජිං ගත කුඳ ගජිං
තරිකිට කුඳ ගජ්ජිං ගජ්ජිං
කුකුඳ කුඳ ගජිං
තක ජිං ගත කුං ජිං
ගත කුංත කුංතත් ජිං
තකුං තකුං ජිං ජිං ගජ්ජිං

| | | |
|---|---|---|
| ආශිර්වාද පදය | - | තරිකිට කුංදත් කුංදත් ජිං ජිං<br>ගත්තත් කුංදත් කුංදත් ගජ්ජිං ///<br>තරිකිට කුංදත් කුංදත් ගජ්ජිං //<br>තරිකිට කුංදත් කුංදත් ගජ්ජි ගත<br>කුංත කුංතත් ජිං<br>තකුං තකුං ජිං ජිං ගජ්ජිං |
| ගුරු පදය | - | තකුඳත් ජිං ජිං තකු තක ජිං ජිං ///<br>තකු තක ජිං ජිං ///<br>කුජිං කුජිං දොං දොං තා |
| වට්ටම් පිරිමේ පදය | - | තක් කෲරුන් /// කෲරුන් ///<br>කුං කුං ජිං කුංදක් ගජ්ජිං ගත කුඳ ගත<br>කුංත ගජිං ජිං තත් කෲරුන්ත ගජ්ජිං<br>කුංදත් ගත්ජිං කුඳ ගත් තත් ජිං ජිං කුංජිං ///<br>කුං කුං ජිං කුංදත් ගජ්ජිං ගත කුඳ ගත<br>කුංද ගජිං ජිං තත් කෲරුන්ත ගජිං<br>කුංදත් ගජ්ජිං |
| පළමු වට්ටම | - | තකජිං /// කුංදක් ගජ්ජිං<br>තකට කුඳ ගජිං කංදක් ගජ්ජිං<br>තකට කුඳ ගජිං /// කුංදක් ගජ්ජිං<br>තරි රොඹි තක ජිං කුංදක් ගජ්ජිං<br>තරි රොඹි තකජිං /// කුංදක් ගජ්ජිං<br>කිටි තකට ජිකට තකට කුළිං .......... |

- පළමු වට්ටම ආරම්භය දක්වා වාදනය ප්‍රමාණවත් වේ.

**පහතරට නර්තන සම්ප්‍රදාය**

| | | |
|---|---|---|
| පළමු වට්ටම | - | දැහිං /// ඊ . . . . රෙගදිත ගත<br>ගුගුඳිත ගත ගුගුඳත් ගත ගුඳත් දැහිං<br>ඊ රිං දිං දැහිං /////<br>දිං දිං ගදිගත ගුඳත් දැහිං //<br>දිං දිං ගදිගත ගුඳත් // ගදිගත ගුඳත් //<br>ගත ගුඳත් // දැහිං /// ඊ . . රිං දිං ගදිගත ගතත්<br>දිං දිං ගදිගත ගතත්<br>දොං දොං තත් ගත්තත් දෙගතත් //<br>දොං දොං තත් // දොං තත් //<br>දොංත ගුඳංත ගතංත ගුඳ ගදිත ගත<br>ගුගුඳිත ගත ගුගුඳත් ගත ගුඳත් දැහිං<br>ඊ රිං දිං දැහිං දිං දැහිං ත ගුම් |

**සබරගමු නර්තන සම්ප්‍රදාය**

පිරිමේ පදය - තත්දොම් තා ගතත් දොංතා ///
ජිංතත් ගතිගත ජිංත ගතිත ගත
ජිංතත් ගති ගත ජිංත ගතා
ගතිතත් ගතිගත ගතිත කුඳිතගත
ගත්තත් ගතිගත ගතිත කුඳා
ජිංතත් ගතිගත ජිංත ගතිත ගත
ගතිතත් ගතිගත ගතිත කුඳිතගත
ජිංතත් ගතිගත ගතිතත් ගතිගත
තත්තත (රොංතක ///) රොං
ජිත්ජිත (රොංතක ///) රොං
තත්තක රොං ජික්ජිත රොං
ගජින්ත ගතිතගතත් ජිං ජිං ජිං ජිංගතත්
ගතිග තත් ගතත් ජිංගතා

වට්ටම - ජිංත ගතිත දොංත ගතා ///
තාකුජිත්තත් ජෙං ජෙං කිත්තත්
ගතිගත කුඳගත ගත්තත් ජෙජ්ජෙං
තහර් රුඳා
ජිංත ගතිතගත දොංත ගතා ///
ගත්තකු ජිත්තත් ජෙජ්ජෙං කිත්තත්
තහර්රුඳා
ජිංතගතිතගත දොංතගතා ///
තාකු ජිත්තත් ජෙජ්ජෙං කිත්තත්
ගතිගත කුඳගත ගත්තත් ජෙජ්ජෙං
තාකුජිත්තත් ජෙජ්ජෙං කිත්තත්
තාකුජිත්තත් ගත්තකු ජිත්තත්
(ගතිගත ///කුඳගත) ///
තාකුජිත්තත් ජෙජ්ජෙං කිත්තත්
ගතිගත කුඳගත ගත්තත් ජෙජ්ජෙං තහර්රුඳා

**ඇගයීම**

- සාම්ප්‍රදායික ගති ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් මගුල් බෙර පළමු වට්ටම වාදනය කරන්න.
- හඬ පාලනයෙන් යුතුව කණ්ඩායමක් ලෙස මගුල් බෙර වාදනය කරන්න.
- දම් - දොම්, ලක - බුරුල පිළිබඳ අවධානයෙන්, හඬ පාලනයෙන් යුතුව තනිව මගුල් බෙර වාදනය කරන්න.

**නිපුණතාව 2.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම 2.1 :** භාරතීය නෘත්‍ය නාටක සංකල්පය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 2.1 :** නෘත්‍ය නාටක සංකල්පය අධ්‍යයනය කිරීම

**ඉගෙනුම් ඵල :**
- භාරතීය නෘත්‍ය නාටක සංකල්පය හඳුන්වයි.
- භාරතීය නෘත්‍ය නාටක බිහිවීම කෙරෙහි බලපෑ පසුබිම විස්තර කරයි.
- භාරතීය නෘත්‍ය නාටක නිර්මාණ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- භාරතීය නෘත්‍ය නාටක නිර්මාණයට දායක වූ ශිල්පීන් හා ඔවුන්ගේ කෘති ඇගයීමට ලක් කරයි.
- භාරතීය නෘත්‍ය නාටකයන්හි සුවිශේෂ ලක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**කාලය :** කාලච්ඡේද 06 යි

**ගුණාත්මක යෙදවුම් :** ඡායාරූප, පින්තූර, පුවත්පත්, ලිපි, සඟරා, දෘශ්‍ය පට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය, ගවේෂණ ක්‍රමය හෝ වෙනත් සුදුසු ක්‍රමවේද භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**
- භාරතීය නෘත්‍ය නාටක බිහිවීමේ පසුබිම.
  - කථකලි නර්තන සම්ප්‍රදාය හා අනෙකුත් භාරතීය නර්තන සම්ප්‍රදායන්ගේ බලපෑම.
  - උදය ශංකර්ගේ පුරෝගාමීත්වය
- භාරතීය නාත්‍ය නාටකවල ස්වරූපය.
  - කථා පුවතක් හෝ සිද්ධි මාලාවක් ප්‍රේක්ෂකයින් හමුවට පැමිණවීම.
  - ඒ සඳහා නර්තනය ප්‍රධාන මාධ්‍ය ලෙස භාවිත කිරීම.
  - ප්‍රකාශනය තීව්‍ර කිරීම සඳහා සංගීතය යොදා ගැනීම.
  - පසුබිම ගායනයේ දී පමණක් වාචික අභිනය යොදා ගැනීම
  - තාලානුකූල හා ප්‍රකාශනාත්මක චලන වැඩියෙන් යොදා ගැනීම.
  - සාත්වික අභිනය හා ආහාර්ය අභිනය සුවිශේෂ බව.
- භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ හා නන්දිකේෂ්වරගේ අභිනය දර්පනයේ එන සිද්ධාන්ත.
  - නෘත, නෘත්‍ය, නාට්‍ය ලක්ෂණ හා සතර අභිනය යොදා ගැනීම.
  - රස නිෂ්පත්තිය කෙරෙහි අවධානය යොමුකොට තිබීම

- නෘත්‍ය නාටක මගින් භාරතීය සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන වන බව.
  - දාර්ශනික පසුබිම
  - ආගමික හා වීර කථා
  - ජන නාටක ලක්ෂණ
- නෘත්‍ය නාටක නිර්මාණකරණයට දායක වූවන් හා ඔවුන්ගේ නිර්මාණ.

| | | |
|---|---|---|
| * උදයශංකර් | - | කල්පනා ජීවන රිද්මය |
| * රවීන්ද්‍රනාත් තාගෝර් | - | ශාප්මෝචන්, චිත්‍රාංගදා, තායශෝවේතා හා සමාජය |
| * රුක්මණී දේවී අරුණ්ඩේල් | - | සීතා ස්වයංවරය, රාධා ක්‍රිෂ්ණා, රාම්ලීලා |
| * ශ්‍රීමති මේනකා | - | ක්‍රිෂ්ණලීලා, දේව විජය, මේනකා ලාස්‍යම් |
| * රාම් ගෝපාල් | - | ධරනි |

**ඇගයීම**

- නෘත්‍ය නාටක සංකල්පය විස්තර කරන්න.
- භාරතීය නෘත්‍ය නාටක හා භාරතීය නර්තන සම්ප්‍රදායන් අතර ඇති සම්බන්ධතාව විස්තර කරන්න.
- නෘත්‍ය නාටක නිර්මාණ ශිල්පීන්ගේ දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

**නිපුණතාව 2.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම 2.2 :** සාම්ප්‍රදායික රඟමඬල සහ නූතන වේදිකාව පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වයි.

**ක්‍රියාකාරකම 2.2.1 :** රංග භූමි හා රංග භූමි අලංකරණය පිළිබඳ අධ්‍යයනය කිරීම.

**ඉගෙනුම් ඵල :**
- රංග භූමි යන පදය අර්ථ දක්වයි.
- පැරණි සහ නූතන රංග භූමි සහ ඒවායෙහි සුවිශේෂතා විස්තර කරයි.
- දේශීය ශාන්තිකර්ම, රංග භූමි සැකසීම සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය කලාත්මක ව හසුරුවා ඇති ආකාරය ඇගයීමට ලක් කරයි.
- නූතන රංග භූමි අලංකරණයේ විවිධ ක්‍රම ශිල්ප විස්තර කරයි.

**කාලය :** කාලච්ඡේද 06 යි

**ගුණාත්මක යෙදවුම් :** රූප සටහන්, ඡායාරූප, රංග උපකරණ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය

**විෂය අන්තර්ගතය :**
- රංග භූමිය අර්ථ දැක්වීම
- විවිධ රංග භූමි හා ඒවායේ සුවිශේෂ ලක්ෂණ
  - කවාකාර රංග භූමිය
  - ආරුක්කු වේදිකාව (ප්‍රොසීනියම්)
  - කැරකෙන වේදිකාව
  - අතීත හා වර්තමාන දේශීය රංග භූමි
- දේශීය ශාන්තිකර්ම රංග භූමි
  - සකසා ගැනීමේ සම්මතයන් සහ යොදා ගන්නා අමුද්‍රව්‍ය ශාන්තිකර්ම කවි මගින් දක්වා තිබීම
  - රංග භූමිය හා ප්‍රේක්ෂකයන් අතර ඇති සමීපත්වය
  - ශාන්තිකර්ම රංග භූමියේ ඇති සැරසිලි
- නූතන රංග භූමි අලංකරණය
  - වේදිකා ආලෝකනය
  - පසුතල නිර්මාණ
  - සැරසිලි සඳහා භාවිත කෙරෙන අමුද්‍රව්‍ය
  - තාක්ෂණික ක්‍රම ශිල්ප

**ඇගයීම**

- රංග භූමිය යන්න අර්ථ දක්වන්න.
- විවිධ රංග භූමි නම් කරන්න.
- පැරණි හා නූතන රංග භූමිවල දක්නට ලැබෙන වෙනස්කම් විස්තර කරන්න.
- නූතන රංග භූමි අලංකරණයේ දී භාවිත විවිධ ශිල්ප ක්‍රම විස්තර කරන්න.
- දේශීය රංග භූමි අලංකරණයේ දී පරිසරයෙන් ලබාගන්නා අමුද්‍රව්‍ය කලාත්මක ව හසුරුවා ඇති අයුරු විස්තර කරන්න.

**නිපුණතාව 2.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම 2.2 :** සාම්ප්‍රදායික රංගමඬල සහ නූතන වේදිකාව පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වයි.

**ක්‍රියාකාරකම 2.2.2 :** නර්තන කලාව හා බැඳි වෙස් මෝස්තර පිළිබඳ අධ්‍යයනය කිරීම.

**ඉගෙනුම් ඵල :**

- වෙස් මෝස්තර නිර්මාණයේ දී සාකච්ඡා කෙරෙන මූලික කොටස් දෙක නම් කරයි.
- දේශීය නර්තන සම්ප්‍රදායයන් හි, චරිත ලක්ෂණ තීව්‍ර ව දැක්වීම සඳහා අංග රචනය යොදා ගන්නා අයුරු විස්තර කරයි.
- චරිත ලක්ෂණ මතුකර දැක්වීම සඳහා රංග වස්ත්‍ර යොදා ගන්නා ආකාරය විස්තර කරයි.
- දේශීය නර්තන සම්ප්‍රදායයන් හි චරිත නිරූපනයේ දී වෙස් මෝස්තර භාවිත කර ඇති ආකාරය විමර්ශනය කරයි.
- අද්‍යතන වෙස් මෝස්තර නිර්මාණ විචාරයට ලක් කරයි.

**කාලය :** කාලච්ඡේද 06 යි

**ගුණාත්මක යෙදවුම් :** දෘශ්‍ය පට, ආශ්‍රිත ග්‍රන්ථ, පින්තූර

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, ගවේෂණ ක්‍රමය හෝ ගුරුවරයාට අභිමත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- වෙස් මෝස්තර නිර්මාණය හා බැඳි මූලික කොටස්
  1. අංග රචනය
  2. රංග වස්ත්‍රාභරණ
- වෙස් මෝස්තර නිර්මාණකරනයේ දී භාවිත දේශීය අමුද්‍රව්‍ය
- ගැමි නාටක හා බැඳි වෙස් මෝස්තර අධ්‍යයනය
  - කෝලම් චරිත
  - සොකරි චරිත

- දේශීය නර්තන සම්ප්‍රදායේ චරිත නිරූපණයේ දී යොදා ගෙන ඇති වෙස් මෝස්තර
  - පත්තිනි
  - රිද්දි බිසව
  - සන්නි
  - පාලි
  - වඩිග පටුන
  - සූනියම් යක්ෂණිය
  - අඹ විදමන
- නූතන වේදිකාවෙහි දක්නට ලැබෙන වෙස් මෝස්තර
  - කෘතිම ආලේපන
  - ශිල්පීය ක්‍රමවේද
  - රංග වස්ත්‍ර
  - රංග ආභරණ

**ඇගයීම**

- වෙස් මෝස්තර හා සම්බන්ධ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
- චරිත ලක්ෂණ වඩාත් තීව්‍ර කිරීම සඳහා අංග රචනය සුවිශේෂ ලෙස යොදාගන්නා අයුරු විස්තර කරන්න.
- දේශීය ශාන්තිකර්මයන්හි විවිධ චරිතවල රස භාවයන් මතුකර දැක්වීමට රංග වස්ත්‍රාභරණ ඉවහල් වන අයුරු විස්තර කරන්න.
- වෙස් මෝස්තර නිර්මාණයේ දී යොදාගන්නා ශිල්පීය ක්‍රම පිළිබඳ විස්තරයක් කරන්න.
- අද්‍යතන වෙස් මෝස්තර නිර්මාණ පිළිබඳ ඇගයීමක් කරන්න.

**නිපුණතාව 2.0 : නර්තනය හා බැඳි මූලධර්ම හා සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම 2.2 :** සාම්ප්‍රදායික රංගමඬල සහ නූතන වේදිකාව පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වයි.

**ක්‍රියාකාරකම 2.2.3 :** විදුලි ආලෝකනය හා වර්ණ පිළිබඳ කරුණු දැක්වීම

**ඉගෙනුම් ඵල :**
- සාම්ප්‍රායික රංගමඬල ආලෝකකරණය සඳහා භාවිත කළ ක්‍රම ශිල්ප විස්තර කරයි.
- නූතන වේදිකා ආලෝකකරණය හා බැඳි විදුලි පහන් වර්ග විස්තර කරයි.
- මැක්ස්වෙල් විදුලි ආලෝක වර්ණ ත්‍රිකෝණය ඇඳ දක්වයි.
- වේදිකා ආලෝකකරණයේ දී තුල්‍ය ආලෝකය සැපයිය යුතු ආකාරය රූප සටහන් මගින් දක්වයි.
- වේදිකා ප්‍රසංග සඳහා ආලෝකය සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරයි.
- විදුලි ආලෝක වර්ණ හා තත් වර්ණ සංයෝජනය වගුවක් මගින් දක්වයි.

**කාලය :** කාලච්ඡේද 06 යි

**ගුණාත්මක යෙදවුම් :** රූප සටහන්, ඡායාරූප, වර්ණ සංයෝජනය පිළිබඳ වගු

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

නිරීක්ෂණ ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රම හා වෙනත් සුදුසු ක්‍රමවේද යොදා ගත හැකි ය.

**විෂය අන්තර්ගතය :**
- අතීතයේ රංගභූමි ආලෝකකරණය සඳහා භාවිත විවිධ උපකරණ
  - පන්දම්
  - ලාම්පු
- වර්තමාන වේදිකා ආලෝකකරණයෙහි දී භාවිත වන විදුලි පහන් වර්ග
  - තිත් පහන්
  - ධාරා පහන්

  අනෙකුත් පහන් වර්ග
  - ප්‍රක්ෂේපණ ලාම්පු
  - පරිභ්‍රමණ ලාම්පු
  - රසදිය වාෂ්පී ලාම්පු
  - වර්ණ රෝද
  - වර්ණ පෙරණ
- ආලෝක පාලනය සඳහා භාවිත විද්‍යුත් උපකරණ
  - ආලෝක පාලනය
  - ස්මති පාලකය

- වේදිකා ආලෝකය සපයන්නෙකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු
- විදුලි ආලෝකය පිළිබඳ මැක්ස්වෙල් වර්ණ ත්‍රිකෝණය සහ වර්ණ සංයෝජන කුලකය
  - මූලික වර්ණ
  - ද්විතීයික වර්ණ
  - තෘතීයික වර්ණ

ආලෝකයේ මූලික වර්ණ




**විදුලි ආලෝකයේ වර්ණ කුලකය**




**මැක්ස්වෙල් වර්ණ ත්‍රිකෝණය**

- වර්ණ වර්ගීකරණය
  - සමන වර්ණ
  - දීපන වර්ණ
- ආලෝකයේ වර්ණ හා තත් වර්ණ එක් කිරීමෙන් මැවිය හැකි වර්ණ
  - වර්ණ සංයෝජන වගුව

| ආලෝක වර්ණය / තත් වර්ණය | නිල් | කහ | රතු | කොළ |
|---|---|---|---|---|
| නිල් | නිල් | කලු | කලු | කලු |
| කහ | කලු | කහ | රතු | කොළ |
| රතු | රතු දම් / කලු | රතු | රතු | කහ / දුඹුරු |
| කොළ | කලු | කොළ | කලු | කොළ |

**ඇගයීම**

- වේදිකා ආලෝකකරණයේ දී භාවිත කෙරෙන පහන් වර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- විදුලි ආලෝකනයේ වර්ණ සංයෝජනය මැක්ස්වෙල් වර්ණ ත්‍රිකෝණය මගින් දක්වන්න.
- කුඩා වේදිකාවක් සඳහා සහ විශාල වේදිකාවක් සඳහා තුල්‍ය ආලෝකය සැපයිය යුතු ආකාරය රූප සටහන් මගින් දක්වන්න.
- විදුලි ආලෝක වර්ණ හා තත් වර්ණ සංයෝජනය වගුවක් මගින් දක්වන්න.
- නර්තන අංගයක් සඳහා ආලෝකය සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න.

**නිපුණතාව 3.0 : විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන කලාකෘති නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 3.1 :** ශාන්තිකර්මයන්හි එන චරිත නිරූපණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 3.1 :** සාම්ප්‍රදායික නර්තනයේ එන චරිත නිරූපණය කිරීම

**ඉගෙනුම් ඵල :**

- දේශීය ශාන්තිකර්මයන් හි එන චරිත නිරූපණ අවස්ථා නම් කරයි.
- නර්තන මාධ්‍ය චරිත නිරූපණ අවස්ථාවන් හි දී සාම්ප්‍රදායික බෙරපද, තාල හා කවි ගායනය යෙදෙන අයුරු විස්තර කරයි.
- අදාළ කවි ගායනය කරමින් තෝරාගත් චරිත නිරූපණය කරයි.
- දේශීය ශාන්තිකර්මයන් හි නාට්‍යමය අවස්ථා අධ්‍යයනය කරයි.
- නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය කරයි.

**කාලය :** කාලච්ඡේද 10 යි

**ගුණාත්මක යෙදවුම් :** ශ්‍රව්‍ය දෘශ්‍ය පට, ඡායාරූප, තාලම් පට, පහතරට බෙරය, දවුල

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, ආදර්ශන ක්‍රමය, පියවර ක්‍රමය, අභ්‍යාස ක්‍රමය වැනි ක්‍රමවේද මේ සඳහා වඩාත් සුදුසු ය.

**විෂය අන්තර්ගතය :**

- දේශීය ශාන්තිකර්මයන් හි එන චරිත නිරූපණ අවස්ථා
  - රට යකුමේ නානුමුරය
  - සූනියමේ වඩිග පටුන
  - සබරගමු වෙඩි සන්නිය
  - සබරගමු අඹ විදමන වැනි අවස්ථා (මෙයින් කැමති චරිත දෙකක්)
- සාම්ප්‍රදායික බෙරපද, තාල හා කවි ගායනය අනුව නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය කෙරෙන ආකාරය අධ්‍යයනය
- බෙරපද හා කවි ගායනා යොදා ගනිමින් චරිත නිරූපණයෙහි යෙදීම.
- චරිතයේ ස්වභාවය තීව්‍ර වන අයුරින් අදාළ කවි ගායනය

**රටයකුමේ නානුමුරය (පහතරට)**

පදය - | ගුං - ගුං | දුං ගත් ගත | ගත් - ගත් | තං ගුං ගුඳ |

කවිය - දෙසිද සහ කොකුම් පිනිදිය සඳුන් ගෙ නා
සලිත කර නානු තැටියක සදා ගෙ නා
එහැම දෙන නුරා රන්තැටි ගෙන අති නා
සත් දෙන බිසෝ හිස ගල්වති බෙදා ගෙ නා

නානු සෑදීම
පදය - | දොංත ගතං | ගත් ගත ගුඳ |

නානු ගෑම
පදය - | දොං | ගුන්ද | ගත්ත | ගත්ත | ගුංද | ගත්ත | ගත්ත |

දිය නෑම
පදය - | ගුංද | දෙගත | ගතිග | තගුඳ |

කවිය - කන්ද මුදුන්නේ පොකුණක් මවා ලා
එදිය කෙළින්නට බිසවක් මවා ලා
එපිල, මෙපිල මල් දෙපිලක් මවා ලා
බිසව් නාති රැලි උකුලේ නෙලා ලා

* මෙම කවි ගායනයෙන් අනතුරුව දිය නාන අවස්ථා නිරූපණය විය යුතුය. (දත් මැද මුහුණ දොවන අයුරු, කුණු අතුල්ලා සබන් ගා පිරිසිදු වන අයුරු)

හිස පීරීම
පදය - | දොංත | දොංත | දොංගු | දගත |
| දොං | තකුර | ගතිග | තගුඳ |

හවරිය පැළඳීම, කොණ්ඩය බැඳීම

| දොං - | ගුංද | ගත්ත | ගත්ත |

| ගුංද | ගුඳං | ගත්ත | ගත්ත |

පදය | ජිජිජිරිමි | ජිජිජිරිං | ජිජිජිරිං | ගතිත |

| ගතිගු | දගත් | දැතිං |

**සූනියමේ වඩිග පටුන (පහතරට)**

කෙටි කවි - වඩිග පුර දේසෙන් - සත්දෙන බමුණු ඇවිදින්
පෙර වඩිග පටුනෙන් - එදා බිසවට යාග කරමින්

I පදය - | දොං ග | තං ගත් | දෙගත්ග | තකුදොං |

I කවිය - සක් බඹ ඉසි වර සිට ගෙ න
විෂ්ණු මහේෂ්වර සිට ගෙ න
සතර වරම් දෙවි සිට ගෙ න
වඩිග පටුන කවි පවස න

II පදය - | දෙගත්ග | තකුදොං |

II කවිය - දිලෙන රතැඟිලි කිරණ විලසින් අනෙක බරණින් පළඳිනා
දෙඅත කරවට රුද්‍රාෂ්ටක වැල් සිරස ජටිලය බඳිමිනා
සුරත පොත සහ වමත කුඩය ද ගතය කහවන් පැහැයෙනා
වඩිග දේසෙන් නිපුණ බමුණෙක් ඇවිත් සබයට පැමුණුනා

ඉරට්ටිය - | ගුදිත ගුං | ජිංගත ගත්තත් | ගදිගත | ජිංගත ගත්තත් |
| ගුදිත ගුං | ජිංගත ගත්ත | ගදිතග | ජිංගත ගත්ත |
| ගුදිත ගුං | ජිංගත ගත්ත | දොංත ගතං ගුං | ජිංගත ගුංදත් |
| තා |

**වෙඩි සන්නිය (සබරගමු)**

දවුල් පදය ජිං ගත කුඳ ගත් ගතිගත කුඳ ගත්
ජිගතත් // දෝං ගදිත් තත්

කවිය (කෙටි කවි තාලය)

තඩි අරගෙන තුං මංසල ඉන්නේ
උඩ හැර මුගුරක් සුරත දරන්නේ
දැඩිමුඬ දෙවිඳුගෙ අණ පවසන්නේ
වෙඩි සන්නිය යකු කෙළගෙන එන්නේ

හමාර පදය ජිංගත කුඳ ගත ගතිගත කුඳගත
ජිංගත කුඳ ගත ගතිත කුඳිත් තත්
ගතිගත කුඳ ගත් කුඳ ගත තා

**අඹවිදමන (සබරගමු)**

මහල්ලෙකුගේ චරිත නිරූපණය සඳහා -

| | |
|---|---|
| පදය | කුඳත් තත් කිට තකට ජිංතක |
| කවිය | පින්සාගත වැද සොළි පුර මැදේ - මෙන්<br>සව්සත කරවන හැම සඳේ<br>තිනෙත පිදුනේය පඬි රජු ඔද තෙදේ<br>පත්තිනි දේවිය මිස නැති තෙදේ |
| හමාර පදය | ජිංතගත ගත ගතිත කුඳ කුඳ<br>ජිංතගත්තත් ගතත් කුඳගත තා |

**ඇගයීම**

- දේශීය ශාන්තිකර්මයන්හි චරිත නිරූපණ අවස්ථා නම් කරන්න.
- නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය සිදුවන අයුරු විස්තර කරන්න.
- නිරූපණය කරන ලද චරිතවලට බෙර පද/දවුල් පද තාල තබමින් කියන්න.
- තෝරාගත් චරිතවලට අදාළ සාම්ප්‍රදායික බෙර පද හා කවි පද නිවැරදිව ගායනය කරන්න.
- සාම්ප්‍රදායික බෙර පද, තාල සහ කවි ගායනය අනුව චරිත නිරූපණය කරන්න.

**නිපුණතාව 3.0 : විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන කලාකෘති නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 3.2 :** කෙටි මුද්‍රා නාට්‍යයක් නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 3.2 :** චරිත කීපයක් ඇති කෙටි සිද්ධියක් මුද්‍රා නාට්‍යයක් ලෙස ඉදිරිපත් කිරීම.

**ඉගෙනුම් ඵල :**

- නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය කළ හැකි සිද්ධියක් තෝරා ගනියි.
- තෝරාගත් සිද්ධියෙහි චරිත වෙන් කොට ගෙන එක් එක් චරිතයන්හි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- චරිත සඳහා නර්තනය හා පසුබිම් සංගීතය යොදාගත යුතු ආකාරය පිළිබඳ අදහස් දක්වයි.
- භාව ප්‍රකාශවන පරිදි, නර්තනය මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය කරයි.
- චරිතවල භාවමය හැඟීම් උද්දීපනය වන පරිදි පසුබිම් සංගීතය යොදා ගනියි.
- නර්තනය හා පසුබිම් සංගීතය උචිත පරිදි යොදා ගනිමින් කෙටි මුද්‍රා නාට්‍යයක් නිර්මාණය කරයි.

**කාලය :** කාලච්ඡේද 12 යි

**ගුණාත්මක යෙදවුම් :** බෙර, තාලම්පට, ආදේශ භාණ්ඩ, සංගීත භාණ්ඩ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

නිරීක්ෂණ ක්‍රමය, ගවේෂණ ක්‍රමය, පැවරුම් ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, භූමිකා රංගන ක්‍රමය වැනි ක්‍රමවේද හෝ වෙනත් සුදුසු ක්‍රමවේද මේ සඳහා යොදාගත හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි කෙටි සිද්ධියක් තේරීම.
    - අසා ඇති කථා පුවතක් ඇසුරින් හෝ නිර්මාණය කරගත් සිද්ධියක්
- සිද්ධියට අදාළ අවස්ථා හා චරිත හඳුනාගැනීම.
- අවස්ථා නිරූපණය සඳහා චරිතවලට ගැලපෙන නර්තන නිර්මාණය

- භාව ප්‍රකාශනය පිළිබඳ අවධානයෙන් යුතු ව චරිත නිරූපනය
- චරිතවල ස්වභාවයන් හා අවස්ථා තීව්‍ර කොට දැක්වීම සඳහා පසුබිම් සංගීතය යොදාගැනීම
- චරිත අතර සම්බන්ධතා ගොඩනැගෙන පරිදි සිද්ධි විකාශනය

**ඇගයීම**

- නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය කළ හැකි සිද්ධියක් තෝරාගෙන එහි එන චරිතවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- තෝරාගත් චරිත නිරූපනය සඳහා නර්තන නිර්මාණය කරන්න.
- අවස්ථා හා චරිත තීව්‍ර ව දැක්වීම සඳහා පසුබිම් සංගීතය නිර්මාණය කරන්න.
- නිමාවක් සහිත කෙටි මුද්‍රා නාට්‍යයක් නිර්මාණය කරන්න.

**නිපුණතාව 4.0 : නර්තනය හා බැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.1 :** නර්තන කලාවේ නව ප්‍රවණතා විස්තර කරයි.

**ක්‍රියාකාරකම 4.1 :** නර්තන කලාවේ නව ප්‍රවණතා පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම.

**ඉගෙනුම් ඵල :**

- නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි බලපෑ සාධක විස්තර කරයි.
- නර්තනයේ ප්‍රවර්ධනයට, ජන සන්නිවේදන මාධ්‍ය බලපා ඇති ආකාරය විමර්ශනය කරයි.
- දේශීය නර්තනයේ ප්‍රවර්ධනය සඳහා විදේශීය නර්තන සම්ප්‍රදායන්ගෙන් ලද පිටිවහල විමසීමට ලක් කරයි.
- අද්‍යතන සමාජ රුචිකත්වය නර්තන කලාවේ ප්‍රගමනය කෙරෙහි බලපා ඇති අයුරු පිළිබඳ අදහස් දක්වයි.
- සම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයක් වශයෙන් අධ්‍යාපනයට එක්වීමේ වැදගත්කම අගය කරයි.

**කාලය :** කාලච්ඡේද 08 යි

**ගුණාත්මක යෙදවුම් :** පුවත්පත් ලිපි, සඟරා, දෘශ්‍ය මාධ්‍ය වැඩසටහන්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය සහ වෙනත් ක්‍රමවේද ගුරුවරයාට අභිමත පරිදි යොදාගත හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- දේශීය නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි බලපෑ සාධක
- දේශීය නර්තන කලාව කෙරෙහි භාරතීය හා බටහිර කලාවන්ගේ බලපෑම
  - සාම්ප්‍රදායික නර්තන අංගයන් හි තාල හා අංගහාර ලක්ෂණ විධිමත් වීම.
  - නර්තනය සඳහා සංගීතය යොදා ගැනීම.
  - වේදිකා පරිපාලනය විධිමත් වීම.
  - රංග වස්ත්‍රාභරණ විචිත්‍රත්වයෙන් නිර්මාණය වීම.
  - දේශීය මුද්‍රා නාට්‍ය කලාවක් බිහිවීම කෙරෙහි බලපෑම

- ජන සන්නිවේදන මාධ්‍ය නර්තනයේ ප්‍රවර්ධනයට බලපා ඇති ආකාරය
    - රූපවාහිනී මාධ්‍යයේ බලපෑම
    - සිනමාව මගින් කෙරෙන බලපෑම
    - පුවත්පත් මගින් සිදුවන බලපෑම
    - අන්තර්ජාලය මගින් සිදුවන බලපෑම
- අද්‍යතන සමාජ රුචිකත්වය නර්තන කලාව කෙරෙහි විවිධ අයුරින් බලපා ඇති බව.
    - කාන්තාවන් නර්තනයට යොමු වීම.
    - සමාජ උත්සව සඳහා ප්‍රාසාංගික නර්තන අංග යොදාගැනීම.
    - ගීතවලට නර්තන නිර්මාණ ඉදිරිපත් කිරීම
    - නර්තන නිර්මාණකරනයේ දී විදේශීය ආභාසය දක්නට ලැබීම.
- අධ්‍යාපනික හා ආර්ථික අවශ්‍යතාව නර්තන කලාව කෙරෙහි බලපා ඇති බව.
    - නර්තන සංදර්ශන, තරඟ පැවැත්වීම.
    - නර්තන වාදන කණ්ඩායම් බිහිවීම
    - අධ්‍යාපනික අවස්ථා වර්ධනය වීම
    - නර්තනය හා බැඳි කරුණු ඇතුළත් විමර්ශන හා විචාර ග්‍රන්ථ බිහිවීම.

**ඇගයීම**

- නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි බලපෑ සාධක විස්තර කරන්න.
- දේශීය නර්තන කලාවේ ප්‍රවර්ධනයට විදේශීය නර්තන සම්ප්‍රදායන්ගෙන් ලැබුණු පිටිවහල පිළිබඳ කරුණු දක්වන්න.
- නර්තන කලාවේ ප්‍රගමනයට දායක වූ කලාකරුවන් පිළිබඳ ඇගයීමක් කරන්න.
- නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි ජන සන්නිවේදන මාධ්‍ය බලපෑ අයුරු සාකච්ඡා කරන්න.
- නර්තනය විෂයක් වශයෙන් පාසල් විෂයමාලාවට එක් කිරීම මගින් නර්තන කලාවෙහි සිදු වූ ප්‍රවර්ධනය ඇගයීමට ලක් කරන්න.

**නිපුණතාව 4.0 : නර්තනය හා බැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.2 :** දේශීය වාද්‍ය භාණ්ඩ සමාජ අවශ්‍යතා සඳහා යොදාගැනීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 4.2 :** දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත අවස්ථාවන් සහ එහි සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කිරීම.

**ඉගෙනුම් ඵල :**

- ආගමික කටයුතු සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත අවස්ථා හා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- සමාජ අවශ්‍යතා සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ශාන්තිකර්මයන්හි අන්තර්ගත වාදන අවස්ථා පිළිබඳ තොරතුරු දක්වයි.
- සාමාජීය හා සංස්කෘතික කටයුතුවල දී දේශීය වාද්‍ය භාණ්ඩ භාවිතයේ වැදගත්කම පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**කාලය :** කාලච්ඡේද 06 යි

**ගුණාත්මක යෙදවුම් :** ශ්‍රව්‍ය පට, ඡායාරූප, දෘශ්‍ය පට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

නිරීක්ෂණ ක්‍රමය, ගවේෂණ ක්‍රමය, සාකච්ඡා ක්‍රමය සහ වෙනත් සුදුසු ක්‍රම භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- ආගමික අවශ්‍යතා සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත අවස්ථා සහ එහි සුවිශේෂ ලක්ෂණ
  - දළදා පූජා, ස්ථූප පූජා, පූජා හේවිසි, තේවා හේවිසි, පෙරහැර-හේවිසි වැනි අවස්ථා හා ඒවායෙහි සුවිශේෂ ලක්ෂණ

- සමාජ අවශ්‍යතා සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත අවස්ථා සහ එහි සුවිශේෂ ලක්ෂණ
  - අණබෙර, රණබෙර, මළබෙර, වද බෙර, මඟුල් බෙර, තූර්ය වාදන, ප්‍රසංග සහ උත්සව අවස්ථා සඳහා හා ප්‍රසංග අවස්ථා සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම
- ශාන්තිකර්මයන්හි අන්තර්ගත වාදන අවස්ථා
  - මඟුල් බෙර, අත්‍යාබෙර, යහන් බෙර, වන්දමානම් දැකුම් අත් . . . වැනි සුවිශේෂ වාදන අවස්ථා

**ඇගයීම**

- දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත අවස්ථාවන් නම් කර ඒ හා බැඳි වාද්‍ය භාණ්ඩ වගුගත කරන්න.
- සමාජ අවශ්‍යතාවන්හි දී දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කර ඇති ආකාරය විස්තර කරන්න.
- දේශීය ශාන්ති කර්මයන්හි දක්නට ලැබෙන සුවිශේෂ වාදන අවස්ථා පිළිබඳ ඇගයීමක් කරන්න.

**නිපුණතාව 4.0 : නර්තනය හා බැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.3 :** දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්මයන් හි විද්‍යමාන වන සමාජ සම්බන්ධතා පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 4.3 :** ශාන්තිකර්ම හා බැඳි සමාජ සම්බන්ධතා අධ්‍යයනය කිරීම.

**ඉගෙනුම් ඵල :**

- කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව, සන්නියකුම යන ශාන්තිකර්මයන් හි පුරාවෘත්ත කථා මගින් හෙළිවන සමාජ සාරධර්ම විස්තර කරයි.
- ශාන්තිකර්ම අන්තර්ගතය හා බැඳි හර පද්ධතීන් එදිනෙදා ජීවිතය හා බැඳෙන අයුරු විස්තර කරයි.
- ශාන්තිකර්ම පැවැත්වීම මගින් සමාජ සහජීවනය වර්ධනය වන ආකාරය විස්තර කරයි.
- සමාජ යහ පැවැත්ම වර්ධනය සඳහා ශාන්තිකර්ම මගින් සිදුවන බලපෑම අගය කරයි.

**කාලය :** කාලච්ඡේද 12 යි

**ගුණාත්මක යෙදවුම් :** ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පත්, ලිපිලේඛන

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

ප්‍රදර්ශන ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, සාකච්ඡා ක්‍රමය ආදි ක්‍රමවේදයන් භාවිත කිරීමේ නිදහස ගුරුවරයාට ඇත.

**විෂය අන්තර්ගතය :**

- කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන්මඩුව, සන්නියකුම යන ශාන්තිකර්මයන් හා සම්බන්ධ පුරාවෘත්ත කථා සමාජයේ යහ පැවැත්ම කෙරෙහි බලපාන ආකාරය
  - පුරාවෘත්ත මගින් හෙළිවන සමාජ සම්බන්ධතා හා සාරධර්ම

**කොහොඹායක් කංකාරිය**

* පොරොන්දු කඩකිරීමෙන් වැළකීම
* පවුල් සංස්ථාව ආරක්ෂා කිරීම

* අඹුසැමි විශ්වාසය

**දෙවොල් මඩුව/පහන් මඩුව**

* සතුන් මැරීමෙන් වැලකීම
* වෛර කිරීමෙන් වැලකීම

**සන්නි යකුම**

* කේලාම් කීමෙන් වැලකීම
* බොරු කීමෙන් වැලකීම
* සැකය හා අවිශ්වාසයෙන් ඈත්වීම

- ශාන්තිකර්මයන් හි අන්තර්ගතය තුළ විද්‍යමානවන සාමාජීය සම්බන්ධතා
  - ඇදහිලි හා විශ්වාස
  - චාරිත්‍ර වාරිත්‍ර
  - සාරධර්ම
- ශාන්තිකර්ම පැවැත්වීමේ දී සමාජ සහජීවනය වර්ධනය වන ආකාරය
  - සහයෝගය
  - සමානාත්මතාව
  - ආචාරධර්ම සුරැකීම
  - කැපවීම

**ඇගයීම**

- ශාන්තිකර්මවල සමාජ සාරධර්ම දැක්වෙන අවස්ථා විස්තර කරන්න.
- ශාන්තිකර්ම පැවැත්වීමේ දී ඒ සඳහා සමාජ සහයෝගය ලැබෙන ආකාරය අගයමින් කරුණු දක්වන්න.
- ශාන්තිකර්ම හා බැඳි සාරධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන අයුරු විස්තර කරන්න.
- සමාජයේ යහපැවැත්ම වර්ධනයෙහිලා ශාන්තිකර්ම බලපාන ආකාරය විමසන්න.

**නිපුණතාව 4.0 : නර්තනය හා බැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.4 :** භාරතීය හා බටහිර නර්තන සම්ප්‍රදායන්හි ප්‍රභවය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.4.1 :** බැලේ නාට්‍යයේ ප්‍රභවය හා විකාශනය පිළිබඳ අධ්‍යයනය කිරීම.

**ඉගෙනුම් ඵල :**
- බැලේ නාට්‍යයේ ප්‍රභවය විස්තර කරයි.
- බැලේ නාට්‍යයේ විකාශය සිදුවූ ආකාරය විස්තර කරයි.
- බැලේ නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන්ගේ දායකත්වය පිළිබඳ අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.
- හංසවිල බැලේ නාට්‍යයෙහි ප්‍රාසාංගික බව පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි.
- දේශීය මුද්‍රා නාට්‍ය නිර්මාණකරනයේ දී බැලේ නාට්‍ය කලාවෙන් ලබාගත හැකි පිටිවහල අගය කරයි.

**කාලය :** කාලච්ඡේද 06 යි

**ගුණාත්මක යෙදවුම් :** ඡායාරූප, රූපසටහන්, දෘශ්‍ය පට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

නිරීක්ෂණ ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය හෝ සුදුසු වෙනත් ක්‍රමවේද මේ සඳහා යොදාගත හැකි ය.

**විෂය අන්තර්ගතය :**
- බැලේ නාට්‍යයේ ප්‍රභවය ඉතාලියෙහි සිදු වූ බව.
  - 15 සියවසෙහි ඉතාලියේ රාජකීය ප්‍රිය සම්භාෂණවල දී ප්‍රභවය ලැබීම.
  - මුල් ම බැලේ නාට්‍ය ඉතාලියේ නිර්මාණය වීම.
  - රාජකීයයන් විසින් රඟපෑම
- ප්‍රංශයේ බැලේ නාට්‍යයේ වර්ධනය
  - 17 සියවසේ ප්‍රංශයේ දී ව්‍යාප්ත වීම.
  - 14 ලුවී රජුගේ සහ කැතරින් බිසවගේ දායකත්වය
  - වෘත්තීය ආයතන මගින් සංවර්ධනය වීම
  - ග්‍රීසියේ ජිම්නාස්ටික් ක්‍රීඩාව පදනම් වීම
  - රාජකීය කථා, දේවකථා, අද්භූත කථා රඟදැක්වීම.

- එංගලන්තය වැනි රටවල ව්‍යාප්තිය පිළිබඳ කරුණු අධ්‍යයනය කළ යුතු බව.
    * viii වැනි හෙන්රි රජු, I එලිසබෙත් රැජිණ සමය
    * සාමාන්‍ය ජනයා අතර ප්‍රචලිත වීම
    * සමාජ කථා ඇසුරින් බැලේ නාට්‍ය නිර්මාණය වීම.

- රුසියාවේ බැලේ නාට්‍ය වර්ධනය වීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කළ යුතු බව.
    * රාජ්‍ය අනුග්‍රහය
        - මහා පීටර් රජු සමය

අලෙක්ෂියස් රජුගේ දායකත්වය

* බෝල්ෂෝයි රඟමඬල
* හංසවිල නිෂ්පාදනය වීම.
* ජාත්‍යන්තර මට්ටමේ උසස් කලාවක් බවට පත්වීම

- බැලේ නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන්ගේ දායකත්වය පිළිබඳ හඳුනාගත යුතු බව.
    - මාර්ත්‍රා ග්‍රැහැම්, මාර්ගට් ෆොන්ටෙයින්, නිජින්ස්කි වස්ලව්, මයිකල් ෆෝකීන්ස්, ඇනා පැව්ලෝවා, ගලීනා උලනෝවා, කාලෝ බ්ලැසිස්, ඉසඩෝරා ඩන්කන්, ජීන් ජෝර්ජ් නෝවේ

- ලොව ප්‍රකට බැලේ නාට්‍ය කෘති හා හංසවිල බැලේ නාට්‍ය පිළිබඳ තොරතුරු රැස්කළ යුතු බව.
    - හංසවිල, නිදි කුමරිය, ෂිල්පීඩ් වැනි කෘති හඳුනා ගැනීම.
    - හංසවිල බැලේ කෘතියෙහි කථාව, චරිත හා එහි ප්‍රාසාංගික ලක්ෂණ

- දේශීය නර්තන මාධ්‍ය නිර්මාණ කෘති ප්‍රවර්ධනය සඳහා බැලේ නාට්‍ය කලාවෙන් ලබාගත හැකි පිටිවහල අධ්‍යයනය කළ යුතු බව.
    - වේදිකා සැරසිලි හා පසුබිම් නිර්මාණ
    - වේදිකා පාලනය හා ආලෝකනය
    - රංග වින්‍යාසය හා නර්තන විධි
    - ප්‍රාසාංගික ලක්ෂණ

**ඇගයීම**

- බටහිර බැලේ නාට්‍යයේ ප්‍රභවය විස්තර කරන්න.
- බටහිර බැලේ නාට්‍යයේ විකාශය සිදු වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.
- බැලේ නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන්ගේ දායකත්වය අගයමින් කරුණු දක්වන්න.
- හංසවිල බැලේ නාට්‍යයෙහි ප්‍රාසාංගික ලක්ෂණ අගයන්න.
- දේශීය නර්තන කලා කෘති ප්‍රාසාංගික ව නිර්මාණය කිරීම සඳහා බැලේ නාට්‍ය කලාවෙන් ලබාගත හැකි පිටිවහල අගයන්න.

**නිපුණතාව 4.0 : නර්තනය හා බැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.4 :** භාරතීය හා බටහිර නර්තන සම්ප්‍රදායන්හි ප්‍රභවය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.4.2 :** භාරතීය නර්තන සම්ප්‍රදායන්හි ප්‍රභවය හා විකාශනය විමර්ශනය කිරීම

**ඉගෙනුම් ඵල :**
- භාරතීය නර්තන සම්ප්‍රදායේ එන භරත, කථක්, කථකලි, මණිපුරි නර්තන සම්ප්‍රදායයන්ගේ ප්‍රභවය පිළිබඳ කරුණු දක්වයි.
- භාරතීය ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් හතරෙහි විකාශනය පිළිබඳ වෙන වෙනම විස්තර කරයි.
- භාරතීය ප්‍රධාන සම්ප්‍රදායන් හතරෙහි ප්‍රවර්ධනය සඳහා කැපවී කටයුතු කළ ශිල්පීන්ගේ දායකත්වය අගය කරයි.

**කාලය :** කාලච්ඡේද 16 යි

**ගුණාත්මක යෙදවුම් :** පුවත්පත්, ලිපි, සඟරා, ආශ්‍රිත ග්‍රන්ථ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය හෝ වෙනත් සුදුසු ක්‍රමවේද භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**
- භාරතීය නර්තන සම්ප්‍රදායන්ගේ ප්‍රභවයට මුල් වූ කරුණු
  - ආගමික පසුබිම සහ දේව සංකල්පය පදනම් වීම.
- මහා කාව්‍ය ග්‍රන්ථවල එන කතාවස්තු භාරතීය නර්තන සම්ප්‍රදායන්හි රඟදක්වන බව.
  - මහා භාරතය, රාමායනය, ගීතගෝවින්දය, භගවත් ගීතාව
- භරත නාට්‍යම් හි විකාශනය පිළිබඳ කරුණු
  - දේවදාසී සංකල්පය
  - රාජ්‍ය අනුග්‍රහය ලැබීම.

- භරත නාට්‍යම් හි උන්නතිය සඳහා පුරෝගාමී වූවන්ගේ දායකත්වය
  - පන්ඩනාලූර් පෙළපත
  - මීනාක්ෂි සුන්දරම්පිල්ලේ
  - රුක්මණී දේවී අරුණ්ඩේල්
  - බාලා සරස්වතී
  - ශ්‍රීමතී මේනකා
- කථක් නර්තන සම්ප්‍රදායේ විකාශනයට බලපෑ කරුණු
  - දේවාලය ආශ්‍රිත පසුබිම
  - මෝගල් බලපෑම
  - රාජ්‍ය අනුග්‍රහය
- කථක් නර්තන සම්ප්‍රදායේ උන්නතිය සඳහා පුරෝගාමී වූවන්ගේ දායකත්වය
  - නවාබ් වජීද් අලීෂා
  - කල්කා ප්‍රසාද්
  - අච්ජන් මහාරාජ්
  - බිර්ජු මහාරාජ්
  - ජේ. වික්‍රමසිංහ (ශ්‍රී ලාංකික)
- මණිපුරි නර්තන සම්ප්‍රදායේ විකාශනයට බලපෑ කරුණු
  - මණිපු රි නර්තනයෙහි ප්‍රභවයට බලපෑ ආගමික පසුබිම
  - රාස්ලීලා නර්තනය ආගමික පසුබිමක් මත සිදුවීම.
  - රාධා ක්‍රිෂ්ණා කතා ප්‍රවෘත්ති මුල්කරගෙන නර්තන නිර්මාණය වීම.
- මණිපුරි නර්තන සම්ප්‍රදායේ පැවැත්ම සඳහා පුරෝගාමී වූවන්ගේ දායකත්වය
  - රවීන්ද්‍රනාත් තාගෝර්
  - නාභා කුමාර්සිං
- කථකලි නර්තන සම්ප්‍රදාය ගැමි නාටක ලෙසින් ආරම්භ වී විකාශනය වී ඇති බව.
  - ආගමික පූජා හා ජන නාටක ඇසුරෙන් කථකලි නර්තනය බිහිවීම.

    භගවත් ගීතාව, රාමායනය වැනි කාව්‍ය ග්‍රන්ථවල එන කථා නිරූපණය
- කථකලි නර්තනය සඳහා පුරෝගාමී වූවන්ගේ දායකත්වය
  - වල්ලතෝල් නාරායන මෙනන්
  - කෙට්ටාරක්කාර තාම්පුරන්
  - ජමොරින් රජ

- භාරතීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි අධ්‍යාපනික ආයතන
  - භරත නාට්‍ය සම්ප්‍රදාය - කලාක්ෂේත්‍ර
  - කථක් නර්තන සම්ප්‍රදාය - ලක්නව් භාත්කණ්ඩ විශ්ව විද්‍යාලය
  - කථකලි නර්තන සම්ප්‍රදාය - කේරළ කලා මණ්ඩලය
  - මණිපුරි නර්තන සම්ප්‍රදාය - ශාන්ති නිකේතනය

**ඇගයීම**

- භාරතීය නර්තන සම්ප්‍රදායයන් බිහිවීම කෙරෙහි බලපෑ ආගමික පසුබිම විස්තර කරන්න.
- භාරතීය නර්තන සම්ප්‍රදායයන්ගේ විකාශනයට බලපෑ සාධක විස්තර කරන්න.
- භාරතීය නර්තන සම්ප්‍රදායයන් හා බැඳි අධ්‍යාපනික ආයතන පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න.
- නර්තන සම්ප්‍රදායයන්ගේ ප්‍රවර්ධනයට පුරෝගාමී වූවන් පිළිබඳ ඇගයීමක් කරන්න.
- භාරතීය නර්තන සම්ප්‍රදායයන් පිළිබඳ පොත් පිංචක් සකස් කරන්න.

**පරිශීලනය සඳහා ග්‍රන්ථ**

- නන්දිකේශ්වරයන්ගේ අභිනය දර්පනය - සේනාරත්න පතිරණ
- භාරතීය සම්භාව්‍ය නර්තන කලාව - ජයසේන කෝට්ටගොඩ
- සංගීත සංහිතා - විමල් අබේසුන්දර

**නිපුණතාව 5.0 : නර්තන කලාකෘතීන්හි සෞන්දර්යාත්මක වටිනාකම විචාරාත්මක ව අගය කරයි.**

**නිපුණතා මට්ටම 5.1 :** ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන නර්තන අංගයන් හි කලාත්මක ලක්ෂණ පිළිබඳ ව අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම 5.1.1 :** රූපවාහිනී නර්තන වැඩසටහන් විචාරයට ලක්කිරීම.

**ඉගෙනුම් ඵල :**

- රූපවාහිනියෙන් විකාශනය වන නර්තන වැඩසටහන් නම් කරයි.
- එම වැඩසටහන් ප්‍රේක්ෂක රසවින්දනය සඳහා නිර්මාණය කර ඇති ආකාරය විමසුමට ලක්කරයි.
- රූපවාහිනී වාර්තා වැඩසටහන්වල නර්තන, ගායන, වාදන හා රංග වස්ත්‍රාභරණවල ඇති ඖචිත්ත භාවය විමසයි.
- දේශීය සංස්කෘතිය හා සාරධර්ම ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම කෙරෙහි රූපවාහිනී නර්තන වැඩසටහන් හි බලපෑම විමසුමට ලක් කරයි.

**කාලය :** කාලච්ඡේද 08 යි

**ගුණාත්මක යෙදවුම් :** පැවරුම් පත්‍රිකා, අදාළ වැඩසටහන් සහිත දෘශ්‍ය පට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :** සාකච්ඡා, ප්‍රදර්ශන ක්‍රම හෝ වෙනත් සුදුසු ක්‍රමවේද භාවිත කළ හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- රූපවාහිනී මාධ්‍ය ඔස්සේ  දක්නට ලැබෙන විවිධ නර්තන වැඩසටහන්
  - රූපවාහිනී මාධ්‍යයෙහි විවිධ නාලිකා සහ එම නාලිකාවල දක්නට ලැබෙන නර්තන වැඩසටහන්
- රූපවාහිනී නර්තන අංග ප්‍රේක්ෂක රසවින්දනය සඳහා නිර්මාණය කොට ඇති ආකාරය
  - නර්තනය , ගායනය, වාදනය අතර ඇති සහසම්බන්ධතාව
  - අවකාශ භාවිතය
  - රංග වස්ත්‍රාභරණ
  - තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය

- නරඹන ලද නර්තන කලාකෘති දේශිය සංස්කෘතිය හා සාරධර්ම කෙරෙහි කෙසේ බලපාන්නේ දැයි විමර්ශනය
  - නර්තනය, ගායනය හා වාදනය සහ දේශිය සංස්කෘතිය අතර බැඳීම.
  - රංග වස්ත්‍රාභරණවල උචිත බව
  - ගීත/සංගීතය අදාළ බව හා උචිත බව

**ඇගයීම**

- රූපවාහිනී මාධ්‍යයෙන් විකාශනය වන නර්තන වැඩසටහන් නම් කරන්න.
- තෝරාගත් නර්තන අංග මාධ්‍යයට උචිත පරිදි සකස් වී ඇත්දැයි විමසීමක් කරන්න.
- රංග වස්ත්‍රාභරණ ප්‍රස්තුතයට උචිත දැයි විමසීමට ලක් කරන්න.
- රංග රටා, දිසා, තල භාවිතය නර්තන අංගයෙහි අලංකාර වර්ධනයට ඉවහල් වී දැයි විමසීමට ලක් කරන්න.
- රූපවාහිනී නර්තන වැඩසටහන් නිෂ්පාදනයේ දී දේශීය සංස්කෘතික සාරධර්ම සුරැකීම පිළිබඳ කෙසේ කටයුතු කළ යුත්තේ දැයි අදහස් දක්වන්න.

**නිපුණතාව 5.0 : නර්තන කලාකෘතීන්හි සෞන්දර්යාත්මක වටිනාකම විචාරාත්මක ව අගය කරයි.**

**නිපුණතා මට්ටම 5.2 :** දේශීය මුද්‍රා නාට්‍යයන්හි කලාත්මක ලක්ෂණ විචාරයට ලක් කරයි.

**ක්‍රියාකාරකම 5.2 :** නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ කලාත්මක ලක්ෂණ අගය කිරීම.

**ඉගෙනුම් ඵල :**

- නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ තේමාව හා මුද්‍රා නාට්‍ය සංකල්පය අතර ගැලපීම පිළිබඳ කරුණු දක්වයි.
- නල දමයන්ති නාට්‍යයෙහි සංගීතය, තේමාව, විකාශනය සඳහා කොතෙක් දුරට ඉවහල් වේදැයි විමසීමට ලක් කරයි.
- අවස්ථා තීව්‍ර ව දැක්වීම සඳහා චලන උපයෝගී කරගෙන ඇති ආකාරය පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි.
- රංග වස්ත්‍රාභරණවල ඖචිත්‍ය බව අගය කරයි.
- දේශීය හා විදේශීය නර්තන සම්ප්‍රදායයන්ගෙන් ලබා ඇති ආභාසය පිළිබඳව කරුණු දක්වයි.
- ප්‍රාසාංගික බව තිව්‍ර කිරීම සඳහා ගෙන ඇති උත්සාහය විමර්ශනය කරයි.
- නල දමයන්ති වේදිකාගත කිරීමේ දී යොදාගත් ශිල්පීය දායකත්වය ඇගයීමට ලක් කරයි.

**කාලය :** කාලච්ඡේද 10 යි

**ගුණාත්මක යෙදවුම් :** දෘශ්‍ය පට, පින්තූර, පුවත්පත් ලිපි

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන හෝ වෙනත් උචිත ක්‍රම මේ සඳහා යොදාගත හැකි ය.

**විෂය අන්තර්ගතය :**

- නල දමයන්ති මුද්‍රා නාට්‍යයෙහි තේමාව හඳුනාගැනීම
  - භාරතීය කතා පුවතක් පාදක කර ගැනීම.
  - මුද්‍රා නාට්‍ය මාධ්‍ය හා තේමාව අතර ගැලපීම.
- නල දමයන්ති මුද්‍රා නාට්‍ය සඳහා යොදාගෙන ඇති සංගීතය
  - ගී පද රචනය
  - සංගීත නිර්මාණය
  - ගායනය
  - භාවිත වාද්‍ය භාණ්ඩ

- තේමාව විකාශනය සඳහා නර්තන නිර්මාණය කර ඇති ආකාරය
  - චරිත නිරූපණය - නල කුමරු, දමයන්ති, හංස රැජිණ, පුෂ්කර
  - අවස්ථා - දාදු කෙළිය, හංස රංගනය
  - රංග වින්‍යාසය
- චරිත නිරූපණය සඳහා භාවිත රංග වස්ත්‍රාභරණවල ඖචිත්‍යභාවය
  - චරිත සඳහා
  - අවස්ථා සඳහා
- අවස්ථා තීව්‍ර කිරීම සඳහා භාවිත කර ඇති ශිල්ප ක්‍රම
  - රංග වස්ත්‍රාභරණ
  - වේදිකා සැරසිලි හා උපකරණ
  - පසුතල නිර්මාණ
  - වේදිකා ආලෝකනය
- දේශීය හා විදේශීය නර්තන සම්ප්‍රදායයන්ගෙන් ලබා ඇති ආභාසය
  - ඇසුරු කර ඇති නර්තන සම්ප්‍රදායයන්
  - සංගීතය
  - රංග වස්ත්‍රාභරණ
  - වේදිකා සැරසිලි

**ඇගයීම**

- නල දමයන්ති මුද්‍රා නාට්‍ය තේමාවෙහි ගැලපීම පිළිබඳ අදහස් දක්වන්න.
- චරිත හා අවස්ථා තීව්‍ර කර දැක්වීම සඳහා රංග වස්ත්‍රාභරණ, පසුතල නිර්මාණ, විදුලි ආලෝකනය භාවිත කර ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.
- නල කුමරු, දමයන්ති, හංස රැජිණ, පුෂ්කර යන චරිත සඳහා නර්තනය නිර්මාණය වී ඇති අයුරු විස්තර කරන්න.
- නර්තන නිර්මාණයේ දී දේශීය හා විදේශීය සම්ප්‍රදායයන්ගෙන් ලබා ඇති ආභාසය පිළිබඳ විමසීමක් කරන්න.
- නල දමයන්ති මුද්‍රා නාට්‍යය නිර්මාණ කොට වේදිකාගත කිරීමේ දී ලත් ශිල්පීය දායකත්වය අගය කරන්න.

**නිපුණතාව 6.0 : නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 6.1 :** දේශීය නර්තන කලාවේ පෝෂණයට අනෙකුත් කලාවන්ගෙන් ලැබෙන පිටිවහල පිළිබඳ කරුණු දක්වයි.

**ක්‍රියාකාරකම 6.1 :** නර්තන කලාවේ පෝෂණයට චිත්‍ර කලාවෙන් ලැබෙන පිටිවහල අධ්‍යයනය කිරීම.

**ඉගෙනුම් ඵල :**
- දේශීය නර්තන කලාව හා චිත්‍ර කලාව ස්වාධීන කලා දෙකක් බව විස්තර කරයි.
- චිත්‍ර කලාවේ මූලික අංග විස්තර කරයි.
- චිත්‍ර කලාවෙහි මූලිකාංග නර්තන කලාව හා බැඳෙන ආකාරය විමසුමට ලක් කරයි.
- රංග රචනය හා චිත්‍ර සම්පිණ්ඩනය අතර සමානරූපී ලක්ෂණ විමසයි.

**කාලය :** කාලච්ඡේද 10 යි

**ගුණාත්මක යෙදවුම් :** රූප සටහන්, දෘශ්‍ය පට, වෙස්මුහුණු, රංග වස්ත්‍රාභරණ කට්ටල

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පැවරුම් ක්‍රමය, ව්‍යාපෘති ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය හෝ සුදුසු වෙනත් ක්‍රමවේද යොදාගත හැකි ය.

**විෂය අන්තර්ගතය :**
- නර්තනය හා චිත්‍ර කලාව ස්වාධීන කලා අංග දෙකක් බව.
  - නර්තනයේ මාධ්‍යය චලනය සහ චිත්‍ර කලාවේ මාධ්‍යය වර්ණ හා රේඛා වීම
- චිත්‍ර කලාවේ මූලික අංග
  - ඇඳීම, ඇඹීම, කැටයම් කැපීම, වර්ණ ගැන්වීම, නෙලීම.
  - රේඛා, හැඩතල, මෝස්තර
- චිත්‍ර කලාවෙහි මූලිකාංග නර්තන කලාව හා බැඳෙන ආකාරය
  - චිත්‍ර කලාවෙහි මූලිකාංග හා නර්තන කලාවේ අංග අතර බැඳීම
  - සැරසිලි

- රංගභූමි අලංකරණය
- පසුතල නිර්මාණය
- රංග වස්ත්‍රාභරණ
- රංග උපකරණ
- වෙස් ගැන්වීම
- වෙස් මුහුණු
- බලි ඇඹීම හා ඇඳීම

- රංග රචනය සහ චිත්‍ර සම්පිණ්ඩනය අතර සහසම්බන්ධතාව
    - සමබරතාවය
    - රිද්ම, රටා හා මෝස්තර
    - සම්බන්ධතා
    - හැඩතල
    - අවකාශ භාවිතය

**ඇගයීම**

- චිත්‍ර කලාවේ මූලික අංග විස්තර කරන්න.
- චිත්‍ර කලාව හා බැඳි මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අයුරු විමසුමට ලක් කරන්න.
- රංග රචනය හා චිත්‍ර සම්පිණ්ඩනය අතර ඇති සමාන ලක්ෂණ විස්තර කරන්න.

**නිපුණතාව 6.0 : නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 6.2 :** නර්තන අංග සඳහා රංග වස්ත්‍ර ආකෘති නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 6.2 :** දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් රංග වස්ත්‍ර කට්ටලයක ආකෘතියක් නිර්මාණය කිරීම.

**ඉගෙනුම් ඵල :**

- දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් රංග වස්ත්‍රාභරණයන්හි දක්නට ලැබෙන සුවිශේෂ වෙනස්කම් විමර්ශනය කරයි.
- නිර්මාණය කිරීමට බලාපොරොත්තුවන රංග වස්ත්‍රාභරණ ආකෘතියෙහි දළ සටහනක් සකස් කරයි.
- අමුද්‍රව්‍ය නිසි පරිදි හසුරුවමින් සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබිඹු වන පරිදි දළ සටහනට අනුව රංග වස්ත්‍ර ආකෘතිය සකස් කරයි.
- රංග වස්ත්‍ර ආකෘතියක් නිර්මාණය කිරීමෙන් වර්ණ ගැලපීම, හැඩතල මතුකිරීම, රේඛා, මෝස්තර, නිමාව පිළිබඳ අත්දැකීම් ලබයි.

**කාලය :** කාලච්ඡේද 16 යි

**ගුණාත්මක යෙදවුම් :** රංග වස්ත්‍ර ඇතුළත් රූප සටහන්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය සහ ගුරුවරයාට සුදුසු වෙනත් ක්‍රම යොදාගත හැක.

**විෂය අන්තර්ගතය :**

- දේශීය රංග වස්ත්‍රවල සාම්ප්‍රදායික ලක්ෂණ අධ්‍යයනය
  - වෙස් ඇඳුම් කට්ටලය
  - දෙවොල්/තෙල්මෙ ඇඳුම් කට්ටලය
  - සබරගමු ඇඳුම් කට්ටලය
  - මෝස්තර නිර්මාණය, වර්ණ, අමුද්‍රව්‍ය, පරිමාණ ලක්ෂණ
- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුව නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රංග වස්ත්‍රාභරණ ආකෘතියේ දළ සටහනක් සැකසීම
  - උඩරට/පහතරට/සබරගමු (ගැහැනු/පිරිමි)

- ආකෘති නිර්මාණය සඳහා අමුද්‍රව්‍ය තෝරාගැනීම
- මූලධර්ම අනුගමනය කරමින් රංග වස්ත්‍ර ආකෘති නිර්මාණය කළ යුතු බව.
  - අමුද්‍රව්‍ය භාවිතය
  - වර්ණ ගැලපීම
  - රේඛා, මෝස්තර, හැඩතල
  - පරිමාණ ලක්ෂණ
  - නිමාව

**ඇගයීම**

- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුව සැකසීමට බලාපොරොත්තු වන රංග වස්ත්‍ර ආකෘතියෙහි දළ සැලැස්ම ඇඳ දක්වන්න.
- එම රංග වස්ත්‍ර ආකෘතිය නිම කිරීම සඳහා භාවිත කිරීමට යෝජනා කරනු ලබන අමුද්‍රව්‍ය නම් කරන්න.
- යෝජිත සැලැස්ම අනුව අදාළ රංග වස්ත්‍ර කට්ටලය සකස් කරන්න.

# 8.0 පාසල පදනම් කරගත් ඇගයීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිළි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියාකරන බවත්, එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයෙකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයෙකු ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදා ගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේදැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරින් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතික ව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථොක්ත අරමුණ සහිතව ක්‍රියාකරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලියත්, සිසුන් ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවයෙන් යුක්ත ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන්

වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය.

| | |
|---|---|
| 01. පැවරුම් | 02. ව්‍යාපෘති |
| 03. සමීක්ෂණ | 04. ගවේෂණ |
| 05. නිරීක්ෂණ | 06. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම |
| 07. ක්ෂේත්‍ර චාරිකා | 08. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 09. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්ව නිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම | 18. ද්විත්ව සටහන් ජර්නල |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය : වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත්, මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## 8.1 ඇගයීම් සැළසුම

**01. ඇගයීම් අවස්ථාව** : පළමුවන වාරය

**02. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 1.1, 1.3

**03. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :**

* ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ගායනය සහිත නර්තන අංග
* ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ගායනය

**04. ඇගයීම් ප්‍රභේදය** : ප්‍රායෝගික ඉදිරිපත් කිරීම

**05. අරමුණු :**

* තෝරාගත් නර්තන අංගය ඉදිරිපත් කිරීමේ දී ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.
* නර්තනයේ දී අදාළ කවි නිවැරදි නාද මාලාව අනුව ගායනා කරයි.
* නර්තන අංගය ප්‍රාසාංගික ව ඉදිරිපත් කරයි.

**06. සැළසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :**

* ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාළව නියමිත ගායනය සහිත හා රහිත නර්තන අංග වෙන්කොට හඳුනාගැනීමට උපදෙස් දෙන්න.
* හඳුනාගත් නර්තන අංග අතරින් ගායනය සහිත කැමති නර්තන අංගයක් තේරාගෙන කණ්ඩායම් වශයෙන් හෝ කේවල වශයෙන් අභ්‍යාස කිරීමට යොමු කරන්න.
* නර්තන අභ්‍යාසයේ දී අනුගමනය කළයුතු සාම්ප්‍රදායික ක්‍රමශිල්ප අනුගමනය කිරීම පිළිබඳ අවශ්‍ය මගපෙන්වීම් කරන්න.
* ගායනය සහිත නර්තන අංගයෙහි නියමිත නාදමාලාව අනුගමනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දෙන්න.
* නර්තන අංග ප්‍රසාංගිකව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන්න.
* අභ්‍යාස කරන ලද නර්තන අංග කණ්ඩායම් වශයෙන් හෝ ඒකල වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
* නර්තන ඉදිරිපත් කිරීමේ දී ගුරුවරයා සිසුනට වාදනයෙන් සහාය වන්න.
* වාදන කුසලතාවය ඇති සිසුනට වාදනයට අවස්ථාව දෙන්න.

**07. ඇගයීම් නිර්ණායක :** **ලකුණු**

| | |
|---|---|
| 1. නර්තන අංගයෙහි සාම්ප්‍රදායික ගතිලක්ෂණ | 04 |
| 2. නර්තනයේ දී නිවැරදි නාදමාලාව අනුව ගායනය | 04 |
| 3. අවකාශ භාවිතය | 04 |
| 4. ශිල්පීය කුසලතාව | 04 |
| 5. ප්‍රාසාංගික බව | 04 |

**ලකුණු දීමේ පටිපාටිය :**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |

## 8.2 ඇගයීම් සැළසුම

**01. ඇගයීම් අවස්ථාව** : පළමුවන වාරය

**02. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 2.1.1, 2.2.1, 4.1.1, 4.4.1, 5.2.1, 6.1.1

**03. ආවරණය කෙරෙන විෂය සන්ධාරය** :

* නල දමයන්ති මුද්‍රා නාට්‍යයෙහි තේමාව හා මුද්‍රා නාට්‍ය සංකල්පය
* අදාළ කථාවස්තුව විකාශනය කිරීමට නිර්මාණකරු යොදාගත් ශිල්පීය ක්‍රම, සංගීතය, නර්තනය, වේදිකා සැරසිලි, රංග වස්ත්‍ර හා විදුලි ආලෝකනය පිළිබඳ තොරතුරු
* මුද්‍රා නාට්‍යයෙහි විද්‍යමාන දේශීය අන්‍යතා ලක්ෂණ
* අදාළ කෘතියෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ භාරතීය හා බටහිර ආභාෂය

**04. ඇගයීම් ප්‍රභේදය** : ඉදිරිපත් කිරීම (Presentation)

**05. අරමුණු** :

* න්‍යායාත්මක ව හා ප්‍රායෝගික ව අධ්‍යයනය කළ විෂය කරුණු විචාරාත්මක ව ඉදිරිපත් කරයි.
* සම්භාව්‍ය දේශීය නර්තන කලා කෘති අධ්‍යයනය කර එම කෘති ප්‍රේක්ෂක රසවින්දනය කෙරෙහි බලපාන ආකාරය විමර්ශනාත්මක ව ඉදිරිපත් කරයි.
* දේශීය අනන්‍යතාව ආරක්ෂාවන පරිදි නල දමයන්ති නිර්මාණයට ගෙන ඇති උත්සාහය පිළිබඳ උදාහරණ සහිතව කරුණු ඉදිරිපත් කරයි.
* බටහිර හා භාරතීය ආභාසය නල දමයන්ති මුද්‍රා නාට්‍යයෙහි සාර්ථකත්වයට බලපා ඇති ආකාරය විස්තර කරයි.
* ශිෂ්‍යයාගේ ඉදිරිපත් කිරීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි. (Presentation Skills)

**06. සැළසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්** :

* පන්තියේ සිසුන් වැඩි පිරිසක් සිටින්නේ නම්, කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
* මාතෘකාවට අදාළ විෂය කරුණු අනුමාතෘකා කීපයකට වෙන්කර ගෙන ඒවා සිසුන්ට බෙදා දෙන්න.
* දෙන ලද අනු මාතෘකාවට අදාළ තොරතුරු රැස්කිරීමට යොමු කරන්න.

* ඉදිරිපත්කිරීම් වල දී රූප සටහන්, පින්තූර, පැහැදිළි කිරීමේ සටහන්, දෘශ්‍ය ආධාරක උපකරණ භාවිතයට ගැනීමට උපදෙස් දෙන්න.
* සැලසුම් කරගත් අනු මාතෘකා ආකර්ශනීය අයුරින් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
* ඉදිරිපත් කිරීම් අවසානයේ අනෙකුත් සිසුන්ට තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී සාකච්ඡාවක් මෙහෙයවන්න.
* ඉදිරිපත් කරන අවස්ථාවේ දී එක් එක් සිසුවාට හිමි ලකුණු පහත සඳහන් නිර්ණායක මත ලබා දෙන්න.

**07. ඇගයීම් නිර්ණායක :** **ලකුණු**

| | |
|---|---|
| 1. මාතෘකාවට අදාළව කරුණු ගොනු කිරීම | 04 |
| 2. නිවැරදි උදාහරණ දැක්වීම | 04 |
| 3. සංවිධානාත්මක ව කරුණු දැක්වීම | 04 |
| 4. කරුණු ඉදිරිපත් කිරීම සඳහා උපක්‍රම භාවිතය | 04 |
| 5. ඉදිරිපත් කිරීමේ කුසලතාවය | 04 |

**ලකුණු දීමේ පටිපාටිය :**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |

# 8.3 ඇගයීම් සැළසුම

**01. ඇගයීම් අවස්ථාව** : පළමුවන වාරය

**02. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 2.2.1, 4.1.1, 4.3.1, 4.4.1, 5.2.1

**03. ආවරණය කෙරෙන විෂය සන්ධාරය** :

* පැරණි හා නූතන රංගභූමි
  (කවාකාර රඟමඬල, ආරුක්කු වේදිකාව, කැරකෙන වේදිකාව)
* රංගභූමි අලංකරණය සඳහා භාවිත විවිධ ක්‍රමශිල්ප
* දේශීය ශාන්තිකර්ම රංගභූමි අලංකරණය හා භාවිත අමුද්‍රව්‍ය
* නර්තන මාධ්‍ය දේශීය කලාකෘතිවල දී භාවිත රංගභූමි අලංකරණ

**04. ඇගයීම් ප්‍රභේදය** : අත්පොතක් සැකසීම

**05. අරමුණු** :

* පැරණි හා නූතන රංගභූමි පිළිබඳ තොරතුරු රැස්කරයි.
* දේශීය ශාන්තිකර්ම රංගභූමි හා රංගභූමි අලංකරණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
* රංගභූමි අලංකරණයේ නූතන ශිල්ප ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**06. සැළසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්** :

* විවිධ රංගභූමි පිළිබඳ තොරතුරු රැස්කිරීමට සිසුන් යොමු කරන්න.
* දේශීය ශාන්තිකර්ම ආශ්‍රිත රංගභූමි හා ඒ හා බැඳි විවිධ අලංකරණ පිළිබඳ දැක්වෙන තොරතුරු අධ්‍යයනය හා කවි, ඡායාරූප, රූප සටහන් රැස්කිරීමට සිසුන් යොමු කරවන්න.
* දේශීය නර්තන කලාකෘති සඳහා භාවිත රංගභූමි අලංකරණ පිළිබඳ තොරතුරු රැස්කිරීමට සිසුන් යොමු කරන්න.
* රැස්කර ගත් තොරතුරු, ඡායාරූප, රූපසටහන් හා කවි ඇතුළත් කොට නිමාවක් සහිත කුඩා අත්පොතක් සැකසීමට සිසුනට උපදෙස් දෙන්න.

**07. ඇගයීම් නිර්ණායක :** **ලකුණු**

| | |
|---|---|
| 1. කරුණු රැස්කිරීම හා මූලාශ්‍ර භාවිතය | 04 |
| 2. කරුණුවල නිරවද්‍යතාව | 04 |
| 3. කරුණු තහවුරු කිරීම සඳහා සම්පත් භාවිතය | 04 |
| 4. සංවිධානාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීම | 04 |
| 5. සමස්ත නිමාව | 04 |

**ලකුණු දීමේ පටිපාටිය :**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |

## 8.4 ඇගයීම් සැළසුම

**01. ඇගයීම් අවස්ථාව** : දෙවන වාරය

**02. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 1.4, 1.2, 1.3, 1.1

**03. ආවරණය කෙරෙන විෂය සන්ධාරය** :

* ප්‍රායෝගික කොටසට අයත් මූලික බෙරපද, අලංකාර බෙරපද හා ගායනය සහිත වාදන

**04. ඇගයීම් ප්‍රභේදය** : ප්‍රදර්ශන

**05. අරමුණු** :

* 1.1, 1.2, 1.3, 1.4 නිපුණතා මට්ටම් යටතේ ආවරණය කළ විෂය සන්ධාරය ඇසුරෙන් වාදන අංගයන් නිර්මාණය කරයි.
* නිවැරදි අක්ෂර උත්පාදනය වන අයුරින් තරගකාරී ස්වරූපයකින් වාදන අංග ඉදිරිපත් කරයි.
* විවිධ තාල රූප ඇසුරු කරගනිමින් වාදන අංග නිර්මාණය කරයි.
* මූලික බෙරපද, අලංකාර බෙරපද හා ගායනය සහිත වාදන අංග ප්‍රදර්ශනය කරයි.

**06. සැළසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්** :

* අදාළ නිපුණතා මට්ටම් යටතේ ආවරණය කළ විෂය සන්ධාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
* ඉගෙනගන්නා ලද මූලික බෙරපද, අලංකාර බෙරපද සහ ගායනය සහිත වාදනයන් ප්‍රදර්ශනය කිරීමේ දී වර්ධනය කරගත යුතු සුවිශේෂ නිපුණතා මට්ටම් පිළිබඳ උපදෙස් දී ඒ ඒ නිපුණතා මට්ටම් හි උපරිමයකට ඉදිරිපත් කිරීමට අවශ්‍ය මඟපෙන්වීම් කරන්න.
* ප්‍රදර්ශන අවස්ථාවන් සැලසුම් කර ඒ සඳහා සිසුන්ගේ පුහුණුවීම් (කණ්ඩායම් හා තනි තනිව) තක්සේරු කරමින් අවස්ථා ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබාදෙන්න.
* වාදන ප්‍රදර්ශනය ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.
* නියමිත දිනයේ දී සිසු වාදන ප්‍රදර්ශනය ඉදිරිපත් කරවන්න. ඇගයීමට ලක්කරන්න.

**07. ඇගයීම් නිර්ණායක :** **ලකුණු**

| | |
|---|---|
| 1. මූලික බෙරපද, දවුල් පද, අලංකාර පද නිවැරදිව වාදනය කිරීම | 04 |
| 2. ගායනය සමග වාදන අංග ඉදිරිපත් කිරීම | 04 |
| 3. නිවැරදි අක්ෂර උත්පාදනය වන සේ වාදන ප්‍රදර්ශනය ඉදිරිපත් කිරීම | 04 |
| 4. ප්‍රාසාංගිකව වාදන ප්‍රදර්ශනය ඉදිරිපත් කිරීම | 04 |
| 5. වාදන ප්‍රදර්ශනය සැලසුම් කිරීම හා නිමාවක් ඇතිව ඉදිරිපත් කිරීම | 04 |

**ලකුණු දීමේ පටිපාටිය :**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |

## 8.5 ඇගයීම් සැළසුම

**01. ඇගයීම් අවස්ථාව** : දෙවන වාරය

**02. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 1.1, 1.2, 1.3, 1.4

**03. ආවරණය කෙරෙන විෂය සන්ධාරය** :

* ප්‍රායෝගික කොටසට අයත් නර්තන, ගායන, වාදන අංග ප්‍රස්තාරකරණය

**04. ඇගයීම් ප්‍රභේදය** : පැවරුම්

**05. අරමුණු** :

* 1.1, 1.2, 1.3, 1.4 නිපුණතා මට්ටම් යටතේ ආවරණය කළ විෂය සන්ධාරය අධ්‍යයනය කරමින් නිවැරදි ව ප්‍රස්තාර කරයි.
* ඉගෙන ගන්නා ලද නර්තන ගායන සහ වාදන අංගයන් හි තාල ලක්ෂණ පිළිබඳ ව ප්‍රායෝගික ව අත්හදා බලමින් ස්වඋත්සාහයෙන් ප්‍රස්තාර කරයි.
* තාලයට ඉදිරිපත් කෙරෙන කෘති ප්‍රස්තාර කර දැක්වීමට ඉදිරිපත් වෙයි.

**06. සැළසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්** :

* අදාළ නිපුණතා මට්ටම් යටතේ ආවරණය කළ විෂය සන්ධාරය පිළිබඳ අධ්‍යයනය කරන්නට උපදෙස් දෙන්න.
* ප්‍රායෝගික කොටස් හි අන්තර්ගත ගායන, වාදන හා නර්තන අංග එකිනෙක ප්‍රායෝගික ව අත්හදා බලමින් ස්ව උත්සාහයෙන් තනි තනිව ප්‍රස්තාර කිරීමට පැවරුම් ලබා දෙන්න.
* තමාට අසන්නට ලැබෙන ගායන, වාදන, නර්තන අංග ප්‍රස්තාර කරන්නට අවශ්‍ය උපදෙස් දෙන්න.
* එක් එක් සිසුන්ගේ පැවරුම් පරීක්ෂා කරමින් ප්‍රබලතා හා දුබලතා හඳුනාගෙන අවශ්‍ය උපදෙස් ලබාදී අපේක්ෂිත නිපුණතා මට්ටමට ළඟාවී ඇත්දැයි ඇගයීමට ලක් කරන්න.

**07. ඇගයීම් නිර්ණායක :** **ලකුණු**

| | |
|---|---|
| 1. අදාළ තාල රූප අනුව විභාග ස්ථාන හා මත්කැටි නිවැරදි ව දැක්වීම | 04 |
| 2. ප්‍රස්තාරකරනයට අදාළ සංකේත නිවැරදිව භාවිත කිරීම | 04 |
| 3. නියමිත තාලරූප අනුව අදාළ නර්තන අංගයන්හි සියලුම පද කොටස් නිවැරදි ව ප්‍රස්තාර කිරීම | 04 |
| 4. අදාළ කවි නිවැරදි ව ප්‍රස්තාර කිරීම | 04 |
| 5. පැහැදිළි ව සහ සිත්ගන්නා ආකාරයට ප්‍රස්තාර සටහන ඉදිරිපත් කර තිබීම | 04 |

**ලකුණු දීමේ පටිපාටිය :**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |

## 8.6 ඇගයීම් සැළසුම

**01. ඇගයීම් අවස්ථාව** : දෙවන වාරය

**02. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 6.1, 6.2

**03. ආවරණය කෙරෙන විෂය සන්ධාරය** :

* උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් රංග වස්ත්‍ර පිළිබඳ අධ්‍යයනය (වර්ණ, රේඛා, හැඩතල, මෝස්තර, යොදාගෙන ඇති අමුද්‍රව්‍ය)
* චිත්‍ර කලාව හා නර්තන කලාව අතර ඇති සහසම්බන්ධතාව
* රංග වස්ත්‍ර නිර්මාණය

**04. ඇගයීම් ප්‍රභේදය** : ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**05. අරමුණු** :

* දේශීය නර්තන සම්ප්‍රදායන්හි රංග වස්ත්‍රවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
* චිත්‍ර කලාව හා නර්තන කලාව අතර සහසම්බන්ධතාව පිළිබඳ රංග වස්ත්‍ර නිර්මාණය ඇසුරු කර ගනිමින් කරුණු දක්වයි.
* හඳුනාගනු ලබන සම්ප්‍රදායට අනුව සැකසීමට බලාපොරොත්තුවන රංග වස්ත්‍ර ආකෘතියක රූප සටහන ඇඳ දක්වයි.
* එම රූප සටහනට අනුව රංග වස්ත්‍ර ආකෘතියක් තනයි.

**06. සැළසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්** :

* නර්තන සම්ප්‍රදායන් තුනට අයත් රංග වස්ත්‍ර පිළිබඳ කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.
  - සජීවී නර්තන අංග ඇසුරෙන්
  - ඡායාරූප, දෘශ්‍ය පට මගින්
  - පොත්පත් ඇසුරෙන්
  - ප්‍රවීන ශිල්පීන් හා සාකච්ඡා මගින්
* එක් එක් සම්ප්‍රදායන්හි භාවිත වර්ණ, රේඛා, හැඩතල මෝස්තර හා අමුද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනයට සිසුන් යොමුකරවන්න.
* හඳුනාගනු ලබන සම්ප්‍රදායට අනුව රංග වස්ත්‍ර ආකෘතියක දළ සටහනක් ඇඳීමට සිසුන් යොමු කරවන්න.

* රංග වස්ත්‍ර නිර්මාණය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය රැස්කිරීමට සිසුනට අවස්ථාව දෙන්න.

* අඳින ලද දළ සටහනට අනුව සාම්ප්‍රදායික ගති ලක්ෂණ ආරක්ෂාවන පරිදි රංග වස්ත්‍ර ආකෘතිය තැනීමට සිසුන් යොමු කරන්න.

**07. ඇගයීම් නිර්ණායක :** **ලකුණු**

| | |
|---|---|
| 1. රංග වස්ත්‍ර ආකෘතියෙහි දළ සටහන ඉදිරිපත් කිරීම | 04 |
| 2. භාවිත අමුද්‍රව්‍යයන්හි යෝග්‍ය බව | 04 |
| 3. රේඛා, හැඩතල හා වර්ණ ගැලපීම | 04 |
| 4. පරිමාණ ලක්ෂණ | 04 |
| 5. නිමාව | 04 |

**ලකුණු දීමේ පටිපාටිය :**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |